The Journal of Archaeology and Heritage Studies (JAHS) 2024: 11 (I) 80-97 pp

JAHS

The Journal of
ARCHAEOLOGY & HERITAGE STUDIES

Journal Home page http://ssh.rjt.ac.lk/index.php/jahs/

Review Paper

මහාවංසයේ ප්‍රථම භාගයෙහි කතුවරයා මහානාම හිමි ද?

මහින්ද සෝමතිලක

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය mahindasomathilake@gmail.com

සංක්ෂේපය

මහාවංසයේ පළමුවන කොටසෙහි රචකයා පිළිබඳව හෝ ඔහු ජීවත් වූ අවධිය ගැන හෝ කිසිදු විස්තරයක් වාර්තාවී නැති හෙයින් එහි කර්තෘත්වය හා කාලනිර්ණය බෙහෙවින් අවිනිශ්චිත තත්ත්වයක පවතී. එහෙත් මහාවංස ටීකාවේ ඇතැම් පිටපත්වල අවසන් පත්ඉරුවෙහි බොහෝ අසීරුවෙන් සකස් කොට ඇති ඡේදයක මහාවංසයේ කතුවරයා දීඝසන්ද සේනාපති විසින් ඉදිකරන ලද පිරිවෙනෙහි වාසය කළ මහානාම නමැති භික්ෂුවක් වූ බවට සඳහන් වේ. මහාවංසයේ දෙවන කොටසෙහි එන ප්‍රකාශයකට අනුව එහි මුල් කොටසේ රචකයා වූ මහානාම හිමි සහ ධාතුසේන කුමාරයා ආරක්ෂා කළ මහානාම හිමි යනු එක් අයෙකු වශයෙන් හඳුනා ගැනීමට ජෝර්ජ් ටර්නර් උත්සාහ ගෙන තිබේ. එහෙත් ධාතුසේන කුමරු ආරක්ෂා කළ තෙරුන් වහන්සේ දීඝසන්ද සේනාපති කළ විහාරයෙහි වාසය කළ බවට සඳහන්ව ඇති නමුත් උන්වහන්සේ මහානාම නමැත්තෙකු වූ බවට එහි වාර්තා කොට නැත. එමෙන්ම ධාතුසේන රජුගේ කාලයෙහිදී දීපවංසය සජ්ඣායනා කළ බවට වන ප්‍රකාශයක් මහාවංසය හැඳින්වීම සඳහා යොදා ඇති බවද ටර්නර්ගේ විශ්වාසයවී තිබේ. එහෙත් දීපවංසය නමැති නාමය මහාවංසය හැඳින්වීම සඳහා කවර කලෙකවත් භාවිත කොට නැති බවත් එය එනමින් හඳුන්වන ලද වෙනත් ග්‍රන්ථයක් වන බවත් හොඳින් පැහැදිලි වේ. එසේ වුවත් සීගිරි පර්වතයෙහි ඉදිකළ විහාරයක් පළමුවන මොග්ගල්ලාන රජුගේ කාලයෙහිදී දීඝසන්ද විහාරයේ වාසය කළ මහානාම නම් තෙරුන් වහන්සේට පූජා කළ බවට මහාවංසයේ වෙනත් තැනෙක සඳහන්ව තිබේ. එහෙත් මෙම තෙරුන් වහන්සේලාගෙන් කිසිවෙකු හෝ මහාවංසය රචනා කරන ලද බවට සඳහන්ව නැති බැවින් එය ධාතුසේන රජුගේ හෝ මොග්ගල්ලාන රජුගේ හෝ කාලයෙහිදී ලියා ඇති කෘතියක් වශයෙන් සැලකීමට අසීරු වේ. මහානාම නමැති භික්ෂූන් වහන්සේලා කිහිප දෙනෙකුම එකල අනුරාධපුරයෙහි වාසය කොට ඇති බවට සාක්ෂි හමුවන බැවින් මෙම තත්ත්වය අතිශයින්ම සංකීර්ණ වන බව පෙනේ. ඒ අතුරින් සද්ධම්මප්පකාසිනී නම් කෘතිය රචනා කොට ඇති තෙරුන් වහන්සේ මහාවංසයෙහි පළමුවන කොටස ලියා ඇති බවත් ඉන්දියාවේ බුද්ධගයාවෙහි ඇති අභිලේඛනයක සඳහන් වන විස්තරයකින් එය හොඳින් තහවුරු වන බවත් පරණවිතානයන් විස්තර කොට තිබේ. එහෙත් එයද කිසිදු පදනමකින් තොර හුදු කාල්පනික විශ්වාසයක් පමණක්ම වන බව පෙනේ. එබැවින් මහාවංසයේ කර්තෘත්වය සහ කාලනිර්ණය යනු තවමත් නොවිසඳී ඇති ප්‍රශ්න දෙකක් වශයෙන් සැලකිය හැකිය.

ප්‍රමුඛ පද: මහාවංසය, වංසත්ථප්පකාසිනි, මහානාම, කර්තෘත්වය, කාලනිර්ණය

ARTICLE INFO

Article history:
Article Received: 05 October 2024
Revision Received: 20 February 2025
Accepted: 28 May 2025
Available online: 10 June 2025

JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

1. හැඳින්වීම

මහාවංසය යනු ක්‍රිස්තු පූර්ව හයවන සියවසෙහි සිට ක්‍රිස්තු වර්ෂ දහනවවන සියවසේ මුල් භාගය වන තෙක්, සියවස් විසිපහක පමණ මෙරට ඉතිහාසය අඛණ්ඩව, අවස්ථා කිහිපයකදී සංග්‍රහ කොට තිබෙන, අතිශය වැදගත් ග්‍රන්ථයකි. එතැන් සිට වර්තමාන අවධිය තෙක් දිවයිනේ මෑත කාලීන ඉතිහාසයද මහාවංසය නමින්ම හඳුන්වනු ලබන ග්‍රන්ථාවලියෙහි නූතන කාණ්ඩයන්හි ඇතුළත් කොට තිබේ. එබැවින් ඒවායින් ක්‍රි.පූ. හයවන සියවසේදී සිටි බුදුන් වහන්සේගේ කාලයෙහි සිට ක්‍රි.ව. තුන්වන සියවසේ අග භාගයෙහි සහ හතරවන සියවසේ මුල් භාගයෙහි සිටි මහසෙන් (274-301) රජුගේ පාලන සමයේ අවසාන භාගය තෙක් වූ දළ වශයෙන් වසර දහසකට ආසන්න කාලයක් ආවරණය කොට තිබෙන මහාවංසයේ පළමු කොටස ගැන පමණක් මෙහිදී අවධානය යොමු කරනු ලැබේ.[1] “ඉතිහාසය හැදෑරීමට පෙර ඉතිහාස රචකයා හදාරන්නයැයි” කියැවෙන සිද්ධාන්තයක් සහ “ඉතිහාසයේ කොඳු ඇටය කාලනීර්ණයයැයි” කියැවෙන පිළිගැනීමක් ඉතිහාස විෂයයෙහිදී මෙන්ම ඉතිහාසකරණයෙහිදීද භාවිතයේ පවත්නා බැවින් මහාවංසයේ ඇතුළත්වී තිබෙන කරුණු හෝ ඒවායෙහි ඓතිහාසිකත්වය පිළිබඳව හෝ නොව එහි කර්තෘත්වය සහ කාලනිර්ණය සම්බන්ධයෙන් පමණක්ම ඉතා විශේෂයෙන් තොරතුරු විමසා බැලීමට මෙම ලිපියෙහි උත්සාහ ගෙන තිබේ (කා 1973: 33-34, 57; සෝමතිලක 2021: 51, 67, 246, 254-255). කවර හෝ ඉතිහාස ග්‍රන්ථයක ගෙනහැර දක්වා ඇති විස්තර කෙරෙහි අවධානය යොමු කිරීමට පෙර එහි කතුවරයා සහ ඔහුගේ සමාජ ආර්ථික පරිසරය පිළිබඳව මුලින්ම තොරතුරු විමසා බලා, ඉන් අනතුරුව එහි ඇතුළත් වන කරුණු ගැන සොයා බැලිය යුතු බව මෙයින් අදහස් කරනු ලැබේ. කතුවරයා කවරෙකුදැයි නොදන්නා ග්‍රන්ථයකදී මෙන් නොව අදාළ රචකයා පිළිබඳව නිසැකවම දන්නා කෘතියකදී එහි ඇතුළත් වන කරුණු, එම තොරතුරු ඉදිරිපත් කොට තිබෙන පරමාර්ථ සහ ඔහුගේ පෞද්ගලික දෘෂ්ටිකෝණය වැනි බොහෝ අංශ පිළිබඳව නිවැරදි තීරණවලට ඉතිහාසඥයකුට ඉතා පහසුවෙන්ම එළැඹිය හැකිවීම ඊට ප්‍රධානතම හේතුවයි. මෙලෙස කවර හෝ ඉතිහාස ග්‍රන්ථයක කර්තෘත්වය සහ කාලනීර්ණය යනු එහි ඇතුළත් වන කරුණු හා සමානම වටිනාකමකින් යුක්ත, බෙහෙවින් වැදගත් අන්තර් සබඳතාවක් සහිත ඉතා තීරණාත්මක විෂයය ක්ෂේත්‍ර දෙකක් වන හෙයින්ද ශ්‍රී ලාංකේය ඉතිහාසය සංග්‍රහ කොට ඇති ප්‍රධානතම මූලාශ්‍රය වශයෙන් මහාවංසය සලකනු ලබන බැවින්ද එහි මුල්ම කොටසෙහි කතුවරයා සහ එය ලියන ලද කාලය පිළිබඳව තොරතුරු විමසා බැලීමේ අපේක්ෂාවෙන් මෙම ලිපිය සකස් කොට තිබේ. ඒ පිළිබඳව තොරතුරු සොයා බැලීමට උපකාරී වන එම ග්‍රන්ථයෙහිම ඇතුළත්වී තිබෙන විස්තර, වෙනත් මූලාශ්‍රයන්හි මීට අදාළව සඳහන්වී ඇති කරුණු සහ වර්තමාන උගතුන් විසින් මේ සම්බන්ධයෙන් පළ කොට ඇති අදහස් යන අංශ කෙරෙහි පමණක් මෙහිදී විශේෂයෙන් අවධානය යොමු කොට තිබේ.

[1] අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවත්නා ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විසින් පැරණි මහාවංස පුස්කොළ පොත ලෝක උරුම ලේඛනයක් වශයෙන් නම් කරන ලෙසට ඉල්ලා පැරිසියේ යුනෙස්කෝ ආයතනයට යෝජනා කළ කමිටුවෙහි විෂයය විශේෂඥවරයකු ලෙසට කටයුතු කළ අවස්ථාවෙහි මහාවංසය පිළිබඳව ඉතා සමීප අධ්‍යයනයක් කිරීමට ඉඩකඩ සැලසුණු බැවින් මෙම ලිපිය සම්පාදනය කිරීමට අවශ්‍ය පසුබිම සකස්කර ගත හැකි විය.

2. මහාවංසය යනු කුමක්ද?

ප්‍රධාන වංශ පරම්පරාව යන සරල අර්ථය මහාවංසය නම් සංඥානාමයෙහි ඇතුළත්ව ඇති බවත් මෙරට රාජවංශය පිළිබඳ ඉතිහාසය යන අදහස කතුවරයා එයින් අපේක්ෂා කොට තිබෙන බවත් මෙහිදී මුලින්ම වටහා ගත යුතුය. මෙම කෘතිය රචනා කොට ඇති කතුවරයා එහි සමාරම්භයෙහිදීම සිය අපේක්ෂාව හෙවත් අභිප්‍රාය කුමක්දැයි පැහැදිලි කොට ඇති හෙයින් මෙරට ඉතිහාසය කුමන පරමාර්ථයකින් ඔහු සංග්‍රහ කොට තිබෙන්නේදැයි යන්න පහසුවෙන් වටහා ගත හැකිය. ඒ පිළිබඳව පාලි බසින් විස්තර කොට ඇති ආකාරයට මහාවංසය රචනා කිරීමෙහිදී පහත දැක්වෙන බලාපොරොත්තු කිහිපය එම රචකයාට මුල්වී තිබෙන බව පෙනේ. එනම්:

“පොරාණෙහි කතොපෙසො - අතිවිත්ථාරිතො ක්වචි
අතීව ක්වචි සංඛිත්තො - අනෙක පුනරුත්තකො
වජ්ජිතං තෙහි දොසෙහි - සුඛග්ගහණ ධාරණං
පාසාද සංවේගකරං - සුතිතෝ ච උපාගතං” යනුවෙනි
(ඌනපූරණසහිතො මහාවංසො 1959: 1; 2-3).

JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

මෙම පාලි ගාථා දෙකෙහි අන්තර්ගත වන නූතන සරල සිංහල අර්ථය මෙසේය. "පැරැන්නන් විසින් සම්පාදිත එය ඇතැම් තැනෙක ඉතා විස්තර සහිතවද තවත් තැනෙක ඉතා සංක්ෂිප්තවද ඇති අතර තවත් තැනෙක පුනරුක්තයෙන් ගහණය. මේ දෝෂයන්ගෙන් මිදී අවබෝධ කර ගැනීමට හා ධාරණය කර ගැනීමට පහසු අන්දමින් පහන් සංවේගයද ඇති කරමින් (රචිත මේ ග්‍රන්ථයෙහි) මුඛපරම්පරාවෙන් පැවත ආ පුරාවෘත්ත ඇතුළත් වේ." අදාළ ග්‍රන්ථ නාමය කුමක්දැයි මෙම කෘතියෙහි කිසිදු තැනෙක හෝ සඳහන් කොට නැති නමුත් මහාවංසය රචනා කිරීම සඳහා පැරැන්නන් විසින් සම්පාදනය කරන ලද කිසියම් කෘතියක් ආධාර කොට ගෙන තිබෙන බව මෙයින් ඉතා පහසුවෙන්ම වටහා ගත හැකිය. මහාවංස ටීකාවෙහි සඳහන්වී ඇති විස්තරයක් පදනම් කොට ගෙන එකී මූලාශ්‍රය කුමක්දැයි කිරිබමුණේ පැහැදිලි කොට තිබෙන හෙයින් ඇයගෙන් උපුටා ගත් එම ප්‍රකාශය මෙහි පහත ගෙනහැර දක්වනු ලැබේ. ඇය බෙහෙවින් නිවැරදිව පෙන්වාදී ඇති පරිදි:

> "වංශකථාවේ ආරම්භක ගාථාවෙහිම ඊට මුල් වූ මූලාශ්‍රය ගැන සඳහනක් ඇත. එම මූලාශ්‍රයට විශේෂ නමක් දී නොමැති අතර එය හඳුන්වා ඇත්තේ පොරාණෙහි කතො පෙසො, පැරැන්නන් විසින් කරන ලද්දේය යනුවෙනි. මේ පිළිබඳ විවරණයක් සපයන වංසත්ථප්පකාසිනි කතුවරයා ඒ කෘතිය සීහළට්ඨකථා මහාවංසය බව ඉඳුරා පවසයි. මහාවංසයෙහි එන තොරතුරු බොහොමයක් සීහලට්ඨකථා නම් කෘතියකින් ලබාගත් බව කියවේ. වංසත්ත්පකාසිනියේ කතුවරයා යොදා ඇති පරිදි මෙය සීහලට්ඨකථා මහාවංසය යන සම්පූර්ණ නාමය කෙටි කිරීමකි. වංසත්ථප්පකාසිනියේ ග්‍රන්ථාවසාන පද්‍යයන්හි මහාවංසය (මෙතැන එය සඳහන් කොට ඇත්තේ පද්‍යපදෝරුවංස යන නමිනි) රචනා කරන ලද්දේ සීහළට්ඨකථාවේ සාරය (අත්ථසාරං) රැගෙන යයි පවසා තිබීමෙන් මේ බව පැහැදිලි වේ. බොහෝ විට මෙම කෘතිය හැඳින්වීම පිණිස අට්ඨකථා යන්න පමණක් යොදා තිබෙන බවක්ද පෙනී යයි. මහාසම්මත වංසය පිළිබඳව ඔහු කරන විවරණයේදී එයට ප්‍රධාන වශයෙන් අට්ඨකථා යන්නද ඉන් මදකට අනතුරුව සීහලට්ඨකථා යන්නද යොදා තිබීමෙන් මේ බව පෙනී යයි. මෙසේ වංසත්ථප්පකාසිනි කතුවරයා අට්ඨකථා මහාවංසය හා අට්ඨකථා යන නම් භාවිතා කරන විට එයින් ඔහු අදහස් කරනුයේ එකම ග්‍රන්ථයක් බව නිශ්චය වශයෙන් කිව හැකි වේ." (කිරිබමුණේ 2005: 121).

දැනට ශේෂව නොමැති, එහෙත් වංසත්ථප්පකාසිනිය රචනා කරන කාලයෙහිදී පවා පැවති බව පෙනෙන, සීහලට්ඨකථා මහාවංසය නමින් හඳුන්වන ලද ඉපැරණි ග්‍රන්ථයක් පදනම් කොට ගෙන මහාවංසය සම්පාදනය කොට තිබෙන බව මේ අනුව ඉතා පහසුවෙන්ම වටහා ගත හැකිය. පැරණි ග්‍රන්ථයන්හි "සීහළට්ඨකථා යන නම භාවිත කොට තිබෙන්නේ පාලි ත්‍රිපිටකයට ලියන ලද සිංහල අටුවා ග්‍රන්ථවලටය. මෙයින් පෙනී යනුයේ දිවයිනේ පුරාතන ඓතිහාසික චින්තනය බෞද්ධ අට්ඨකථා සාහිත්‍ය සමග ළඟින්ම බැඳී ඇති බවකි." (කිරිබමුණේ 2005: 114). මේ බව සමන්තපාසාදිකාවේ හැඳින්වීමෙහි ලංකා ඉතිහාසය සංග්‍රහ කොට තිබෙන ආකාරයෙන්ද ඉතා හොඳින් තහවුරු වන බව පෙනේ. මහාවංසය රචනා කිරීමෙන් පසු අවස්ථාවක ලියා ඇති බවට නිසැක, එහෙත් ලියන ලද කාලය සහ කර්තෘත්වය අඥාත එහි ටීකාවෙහි එනම් වංසත්ථප්පකාසිනියෙහි ඉතා පැහැදිලිව සඳහන් කොට තිබෙන පරිදි මෙකී සීහලට්ඨකථා මහාවංසය අනුරාධපුර නගරයෙහි පිහිටා තිබුණු මහාවිහාරයෙහිදී ලියා ඇති කෘතියකි. එකී සීහළට්ඨකථාව පදනම් කොට ගෙන, ඉන්දියාවේ බුද්ධ කාලයෙහි සිට මෙරට මහසෙන් රජුගේ (274-302) පාලන කාලය අවසාන වන තෙක් අවධියෙහි ලංකා ඉතිහාසය පරිච්ජේද තිස්හතකින් සමන්විත වන පරිදි මහාවංසයෙහි මුල් කොටස සංග්‍රහ කොට ඇති බව පෙනේ. මෙම කෘතිය රචනා කිරීමෙන් පසුව එය කෙතරම් වැදගත් ග්‍රන්ථයක් ලෙසට පැරණි උගතුන් විසින් සලකා තිබේදැයි යත් එහි ඇතුළත් වන අර්ථය වටහා ගැනීමට දුෂ්කර වන විශේෂ පදවලට සහ වාක්‍යාංශවලට අරුත් සැපයීමට පමණක් නොව ඊට තවත් අතිරේක තොරතුරු හෝ සටහන් ගෙනහැර දැක්වීමට රචනා කොට තිබුණු, මේ වන විට ශේෂව නැති ගණ්ඨිපදත්ථවණ්ණනා නමැති ගැටපදයක් පවා මහාවංස ටීකාවට හෙවත් වංසත්ථප්පකාසිනියට අමතරව එකල ලියා තිබුණු බවට වාර්තාවී තිබීමෙන්ම වටහා ගත හැකිය.

JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

(වංසත්ථප්පකාසිනි මහාවංසටීකා නම් වූ සිංහල අනුවාදය 1994: p.xii).

එහෙත් මහාවංසයේ පමණක් නොව ඊට පෙර අවස්ථාවක රචනා කොට ඇති බවට පිළිගැනෙන දීපවංසයේද "පිටකත්තය පාලිංච - තස්සා අට්ඨකථම්පිච - මුඛපාඨෙන ආනෙසුං - පුබ්බෙ භික්ඛු මහාමති - හානිං දිස්වාන සත්තානං - තදා භික්ෂු සමාගතා - චිරට්ඨිි තත්ථං ධම්මස්ස - පොත්ථකේසු ලිඛාපයුං" (ඌනපූරණසහිතො මහාවංසො 1959: 33; 102-103; දීපවංසය 1980, 20; 20-21) යනුවෙන් එකම ගාථාවලින් පැහැදිලි කොට ඇති පරිදි ක්‍රිස්තු පූර්ව පළමුවන සියවසෙහිදී සිටි වළගම්බා (ක්‍රිපූ 89-77) රජුගේ කාලයේදී මුල් වරට ත්‍රිපිටකය සහ අට්ඨකථා ග්‍රන්ථාරූඪ කරන තෙක් විවිධ ආචාර්ය පරම්පරා විසින් ඒවා "භාණක ක්‍රමය" මඟින් අඛණ්ඩව, සාමූහික වශයෙන් කටපාඩමින් රැගෙන එන ලද බෞද්ධ සම්ප්‍රදායයක් වන බවට නිසැකය (Adikaram 1953:24). "පොරාණෙහි කතොපෙසො ...." (ඌනපූරණසහිතො මහාවංසො 1959: 1; 2-3) යනාදි වශයෙන් මහාවංසයෙහි සමාරම්භක ගාථාවන්හි විස්තර කොට ඇති කරුණුවලින්ද මේ බව ඉතා හොඳින් පැහැදිලි වේ. මේ අනුව එය අලුතින්ම ලියන ලද කෘතියක් නොව පැරණි අවධියෙහි සිට වාචිකව රැගෙන එන ලද ප්‍රවෘත්ති සංග්‍රහයක් යළි සංස්කරණය කොට සකස් කරන ලද ග්‍රන්ථයක් වන බව බොහෝ පහසුවෙන් වටහා ගත හැකිය. මේ තත්ත්වය කාලනිර්ණය අවිනිශ්චිත මහාවංස ටීකාවෙහි හෙවත් වංසත්ථප්පකාසිනියෙහිද ඉතා හොඳින් පැහැදිලි කොට තිබෙන බව දක්නට ලැබේ.[2] මේ නිසා මුල් සම්පාදකයන් හෙවත් රචකයන් සහ භාණකවරු පිළිබඳ විස්තර මෙම ග්‍රන්ථවලින් මුළුමනින්ම පාහේ ඉවත්ව ගොස් ඇතැයි ඉතා පහසුවෙන්ම අනුමාන කළ හැකිය (දීපවංසය 1980: 20; 20-21; මහාවංශය 1932: 33; 102-103; සෝමතිලක 2014: 88-98). එබඳු අට්ඨකථාවලින් එකක් වූ සීහලට්ඨකථා මහාවංසයෙහි කර්තෘත්වය පිළිබඳ තොරතුරුද මේ හා සමාන අන්මින් පසු කලෙකදී මතකයෙන් ඉවත්ව ගොස් ඇතැයි සිතිය හැකිය. නැතිනම් එය බොහෝ විට සාමූහික ක්‍රියාවක ප්‍රතිඵලයක් වුවද විය හැකිය.

මෙලෙස සකස්වී ඇති ත්‍රිපිටකය සහ අටුවා ග්‍රන්ථ සමූහය අද දක්නට ලැබෙන තත්ත්වයට පත්වී තිබෙන්නේ ක්‍රි.ව. පස්වන සියවස පමණ කාලයෙහිදී බුද්ධඝෝෂ තෙරුන් වහන්සේ ඇතුළු කිහිප දෙනෙකු විසින් ඒවා පාලි බසට නැඟීමේ කටයුත්තෙහි ප්‍රතිඵලයක් වශයෙනි. එහෙත් ඒවා එම තෙරුන් වහන්සේලාට දක්නට ලැබුණු තත්ත්වයට පත්ව තිබෙන්නේ, එනම් ඒවා අවසන් වරට සකස්වීම සිදුවී තිබෙන්නේ ක්‍රි.ව. පළමුවන හා දෙවන සියවස් පමණ කාලයෙහිදී පමණ වන බව එම ග්‍රන්ථාගත තොරතුරුවලින්ම හෙවත් ඒවායෙහි ඇතුළත්ව ඇති අභ්‍යන්තර සාක්ෂි මඟින් හොඳින් තහවුරුවී තිබේ (Adikaram 1953:7). එබැවින් මේ කාලය වන විට ඇතැම් ඓතිහාසික සම්ප්‍රදායයන් මෙරට මුල්බැස ගෙන තිබෙන අන්දම හෙවත් ඒවා හොඳින් තහවුරුවී තිබෙන ආකාරය පහසුවෙන් වටහා ගත හැකිය. කටින් කට රැගෙන එන ලද වාචික සම්ප්‍රදාය වෙනුවට ලිඛිත සාහිත්‍ය ක්‍රමයක් වර්ධනය වීමත් සමඟ ජනකථා හෝ ජනප්‍රවාද වැනි දෑ සමඟ එකතුවීමෙන් ඓතිහාසික කථා පුවත් තවදුරටත් ප්‍රසාරණය වීමට තිබුණු ඉඩකඩ බෙහෙවින් අඩුවී තිබීම මීට ප්‍රධාන හේතුව වශයෙන් සැලකිය හැකිය.

3. මහාවංසයේ කතුවරයා කවරෙකුද?

මෙපරිද්දෙන් අනුක්‍රමයෙන් සංවර්ධනයවී ඇති මෙරට වංශකථා සාහිත්‍යයේ ඉතා වැදගත්ම කෘතියක් වන මහාවංසයෙහි ඇතුළත්ව ඇති තොරතුරු පැහැදිලි

[2] මෙම කෘතිය ක්‍රිව හත්වන සියවසෙහිදී රචනා කරන ලද එකක් විය හැකි බව අකුරටියේ අමරවංස හිමි හා හේමචන්ද්‍ර දිසානායක යන දෙදෙනාගේ මතයවී තිබේ. වංසත්ථප්පකාසිනි මහාවංසටීකා නම් වූ සිංහල අනුවාදය, සංස්. අකුරටියේ අමරවංස හිමි හා හේමචන්ද්‍ර දිසානායක, කැලණිය, 1994, xv-xviii පි. එහෙත් එය අටවන හෝ නවවන සියවස පමණ කාලයෙහිදී ලියන ලද එකක් බව ජී පී මලලසේකරගේ මතයවී තිබේ. G P Malalasekara, The Pali literature of Ceylon, Royal Asiatic Society of Great Britain and Ireland, London, 1928, pp.cv-cix. එසේ වුවත් එය ක්‍රිව 1000 සහ 1250 අතර කාලයෙහිදී හෙවත් එකොළොස්වන සහ දහතුන්වන සියවස් අතර කාලයෙහිදී ලියන ලද කෘතියක් විය හැකි බව ගෛගර්ගේ විශ්වාසය වන බව පෙනේ. W Geiger, Dipavamsa and Mahavamsa, Colombo, 1908, p.34; සිරිමා කිරිබමුණේ, "මහාවංසය හා ලක්දිව පැරණි ඓතිහාසික සම්ප්‍රදාය," ඉතිහාසයේ අතීතය: ශික්ෂණයක වර්ධනය පිළිබඳ විමර්ශනයක්, සංස්. රණවීර ලෙස්ලි ගුණවර්ධන, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2005, 113-114පි.

JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

කිරීම සඳහා පසු කලෙක රචනා කොට තිබෙන මහාවංස ටීකාවෙහි "පජ්ජපදොරුවංස" නමින් මේ කෘතිය පිළිබඳව හඳුන්වා ඇති අතර ඊට මුල්වී තිබෙන ග්‍රන්ථයෙන්, එනම් සීහලට්ඨකථා මහාවංසයෙන් වෙන් කොට දැක්වීමේ අදහසින් එනමින් එය නම් කොට ඇතැයි සිතිය හැකිය (වික්‍රමසිංහ 1965: 4-5). එකී මුල් කෘතියෙහි හෙවත් සීහලට්ඨ කථා මහාවංසයෙහි හෝ එය පදනම් කොට ගෙන පසු කලෙකදී රචනා කොට ඇති මහාවංසයෙහි හෝ ඒවායෙහි රචකයන් පිළිබඳව පමණක් නොව ඔවුන් ජීවත් වූ කාලපරිච්ඡේදයට අදාළ වන විස්තර කිසිවක් හෝ සඳහන් කොට නැති බැවින් එම ග්‍රන්ථයන්හි කර්තෘත්වය හා සම්බන්ධ කිසිදු තොරතුරක් තත් කෘතීන්ගෙන් ලබාගත හැකි වන බව නොපෙනේ. ඒ අතුරින් සීහලට්ඨ කථා මහාවංසය යනු මේ වන විට ශේෂව පවත්නා කෘතියක්ද නොවේ. එහෙත් "නරෝත්තම වූ සිවු බුදු කෙනෙකුන් විසින් මැනවින් සිරිපා ලකුණු තබන ලද මේ උතුම් දිවයින මිසදිටුවනට දක්නට හෝ නොලැබේවා" යන ප්‍රාර්ථනය සහ අරමුණ සහිතව සංග්‍රහ කොට තිබෙන (වංසත්ථප්පකාසිනි මහාවංසටීකා නම් වූ සිංහල අනුවාදය 1994: 558), මහාවංසය රචනා කිරීමෙන් සියවස් කිහිපයකට පසුව ලියා ඇති බවට පිළිගැනෙන, මහාවංස ටීකාවෙහි අග කොටසේ " පජ්ජපදොරුවංසවණ්ණනා" හෙවත් "පද්‍ය පද මහාවංශ වර්ණනාව" නමින් නම් කොට ඇති විස්තරයෙහි මහාවංසයේ කතුවරයා කවරෙකුදැයි යන්න පහත සඳහන් ආකාරයට පාලි බසින් පැහැදිලි කොට තිබෙනු දක්නට ලැබේ.

> "යා එත්තාවතා මහාවංසට්ඨානුසාර කුසලෙන දීඝසන්ද සේනාපතිනා කාරාපිත මහාපරිවෙනවාසිනා මහානාමො ති ගුරූහි ගහිතනාමධෙය්‍යෙන ථෙරෙන පුබ්බ-සීහලභාසිකාය සීහලට්ඨකථාය භාෂාන්තරම් එව වජ්ජියා අත්ථසාරං එව ගහෙත්වා තන්තිනයානුරූපෙන කතස්ස පද්‍යපදොරුවංසස්ස අත්ථවණ්ණනා මයා තම් එව සන්නිස්සිතෙන ආරද්ධා විදේසිස්සරියභය- දුබ්බුට්ඨිභය රෝගභයාදි විවිධඅන්තරාය යුත්තකලිකාලෙ පි අනන්තරායෙන නිට්ඨා නම් පයාටා සබුද්ධ බුද්ධසාවක පච්චේක බුද්ධාදිනම් පොරානානම් වංසත්ථප්පකාසනටො අයං වංසත්ථප්පකාසිනි නාම ති ධාරෙතබ්බා." (Vamsatthappakasini Commentary on the Mahavamsa 1935: 687).

එම ප්‍රකාශය අකුරටියේ අමරවංස හිමි හා හේමචන්ද්‍ර දිසානායක යන උගතුන් දෙදෙන වංසත්ථප්පකාසිනි මහාවංසටීකා නම් වූ සිංහල අනුවාදය නමැති ඔවුන්ගේ ග්‍රන්ථයෙහි මෙසේ සිංහල භාෂාවට පරිවර්තනය කොට තිබෙනු දක්නට ලැබේ.

> "දීක්සඳ සෙනෙවිරදුන් විසින් කරවන ලද මහපිරිවෙන් වැසි, මහාවංශ අර්ථ සාරයෙහි ප්‍රවීණ, ආචාර්යයන් කෙරෙන් ලද මහානාම යන නම් ඇති තෙරුන් විසින්, හෙළ බසින් කරන ලද පැරණි හෙළ අටුවායෙහි භාෂාන්තරය හැර අර්ථ සාරයම ගෙන පෙළ බසට අනුරූප වන සේ කරන ලද පද්‍ය පද මහාවංසයට යම් අර්ථවර්ණනාවක් එයම ඇසුරු කරමින් මවිසින් ආරම්භ කරනු ලැබ, විදේශ ආධිපත්‍ය භය, දුර්භික්ෂ භය, රෝග භය ආදී අනේකවිධ අන්තරාය බහුල කාලයෙක වුවද, එම අන්තරායන්ගෙන් මිදී මෙතෙකින් නිමාවට පත් වූවාද, ඒ මේ අර්ථ වර්ණනාව, බුද්ධ, බුද්ධශ්‍රාවක, ප්‍රත්‍යෙක බුද්ධාදී පෞරාණික උත්තමයන්ගේ වංශය ප්‍රකාශ කරන හෙයින් වංසත්ථප්පකාසිනි නමැයි දත යුතුය" (වංසත්ථප්පකාසිනි මහාවංසටීකා නම් වූ සිංහල අනුවාදය 1994: 557).

එහෙත් මෙම සඳහන පිළිබඳව ඉතා ප්‍රවේශමෙන් අවධානය යොමු කොට ඇති මෙන්ඩිස් ඊට අදාළව ගෙනහැර දක්වා ඇති අදහසක් මේ සම්බන්ධයෙන් බොහෝ වැදගත් වන අතර එය ඉංග්‍රීසි භාෂාවෙන් ඔහු මෙසේ පැහැදිලි කොට තිබෙනු දක්නට ලැබේ. "In the Mahavamsa Tika the author of the Mahavamsa is always called achariya though sometimes other theres are mentioned by name (p.29); but at the end of the work (p.502) in a badly constructed passage, which seems to be a latter addition, the author of the Mahavamsa is said to be Mahanama of the parivena

JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

built by the commander of the troops, Dighasanda." (Mendis 1930:19). මෙම ප්‍රකාශය පහත දැක්වෙන ආකාරයට සිංහල භාෂාවට පරිවර්තනය කළ හැකිය. එනම්: "මහාවංස ටීකාවෙහි වෙනත් තෙරුන් වහන්සේලා ගැන සඳහන් කොට ඇති අවස්ථාවන්හිදී උන්වහන්සේලා නම් වශයෙන්ම ගෙනහැර දක්වා ඇති නමුත් මහාවංසයෙහි කතුවරයා පිළිබඳව පමණක් එහි ආචාර්ය යනුවෙන් සෑම තැනෙකදීම වාර්තා කොට තිබෙන බව දක්නට ලැබේ. එහෙත් මහාවංස ටීකාවේ අවසානයෙහි පශ්චාත්කාලීන අවධියෙහිදී යොදා ඇති බව පෙනෙන බොහෝ අසීරුවෙන් සකස් කොට ඇති ඡේදයක මහාවංසයෙහි කතුවරයා දීඝසන්ද සේනාපති විසින් ඉදිකරන ලද පිරිවෙනෙහි වාසය කළ මහානාම නැමැත්තෙකු වූ බවට කියා තිබේ." මහාවංස ටීකාව සහ එහි ඇතුළත්වී තිබෙන කරුණු පිළිබඳව මෙන්ඩිස් දක්වා ඇති මෙම ප්‍රකාශය බෙහෙවින් නිවැරදි, කිසිසේත්ම අගතිගාමී එකක් නොවන බවට පැහැදිලිය. එබැවින් බොහෝවිට මෙලෙස පසු කාලයෙහිදී මහාවංස ටීකාවෙහි අගට එකතු කොට ඇති බවට පෙනෙන, මහානාම තෙරුන් වහන්සේ ගැන සඳහන්වී ඇති එම ප්‍රකාශය ඇසුරින් මහාවංසයෙහි කර්තෘත්වය සහ කාලනිර්ණය තීරණය කිරීමට යාම කවර පර්යේෂකයෙකු වුවද පහසුවෙන් නොමඟ යාමට ඉඩකඩ ඇති අවස්ථාවක් විය හැකි බව මුලින්ම වටහා ගත යුතුය. නිදසුනක් ලෙස මහාවංස ටීකාවෙහි මේ පිළිබඳව ගෙනහැර දක්වා තිබෙන විස්තරයෙහි " දීඝසන්ද සේනාපතිනා කාරාපිත මහපරිවෙනවාසිනා" යනුවෙන් සඳහන්ව ඇති නමුත් එහි ඇතැම් පුස්කොළ පිටපත්වල ඒ වෙනුවට "කාරාපිතස්ස මහානාමො" යනුවෙන් එම පිරිවෙන මහානාම හිමියන් විසින් සාදන ලද තැනක් වශයෙන් පවා විස්තර කොට ඇති බව මලලසේකර සංස්කරණයෙහි ගෙනහැර දක්වා තිබෙන ඊට අදාළ විෂමපාඨවලින් පැහැදිලි වීමෙන් වටහා ගත හැකිය (Vamsatthappakasini Commentary on the Mahavamsa 1935: 687).

ඊට අමතරව මහාවංසයෙහි රචකයා වූ මහානාම තෙරුන් වහන්සේ අනුරාධපුරයේ පිහිටි බව පෙනෙන, දික්සඳ සෙනෙවියා විසින් කරවන ලද පිරිවෙනක වාසය කළ බවට මහාවංස ටීකාවෙහි ඇතැම් පිටපත්වල පමණක් මෙසේ සඳහන් කොට ඇති නමුත් උන්වහන්සේ විසූ කාලය පිළිබඳ නිශ්චිත තොරතුරු කිසිවක් එහි ඇතුළත්වී තිබෙන බවද නොපෙනේ. ඒ හැරුණු විට එම කෘතියෙහි සඳහන් කොට තිබෙන දීඝසන්ද යනු ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසෙහිදී සිටි දේවානම්පිය තිස්ස රජුගේ සේනාපතියෙකු වූ බවත් ඔහු මහාවිහාරයෙහි චූල ප්‍රාසාදය නම් විහාරයෙහි තම නමින්ම, එනම් දීඝසන්ද යන නාමයෙන්ම යුක්ත පිරිවෙනක් ඉදිකොට එය මහා මහින්ද තෙරුන් වහන්සේට පූජා කරන ලද බවත් මහාවංසයෙහි ප්‍රථම භාගයේ සඳහන්වී තිබේ (The Mahavamsa 1950, 15; 212-213). මහාවංස ටීකාවෙහි පවා මෙම සේනාපතිවරයා ගැන හෝ එම පිරිවෙන ගැන හෝ වැඩි විස්තර කිසිවක් ගෙනහැර දක්වා නැති බවත් "හේ තෙමේ වනාහි දික් සළු හඳනා හෙයින් දික්සඳ නම් වී යයි දත යුතුයි" යනුවෙන් පමණක් එහි සඳහන්කර තිබෙන බවත් දක්නට ලැබේ (වංසත්ථප්පකාසිනි මහාවංසටීකා නම් වූ සිංහල අනුවාදය 1994: 283). එබැවින් මහාවංසයේ කර්තෘත්වය හා කාලනිර්ණය නිවැරදි ලෙස තීරණය කිරීමට නම් ඊට පෙර මෙම විස්තර ඇතුළත්ව ඇති මහාවංස ටීකාව හෙවත් වංසත්ථප්පකාසිනිය කවර කලෙක රචනා කොට තිබෙන ග්‍රන්ථයක්දැයි යන්න මුලින්ම වටහා ගෙන සිටිය යුතුය. එහෙත් එම ග්‍රන්ථයෙහිත් කර්තෘත්වය සහ කාලනිර්ණය පිළිබඳව තොරතුරු කිසිවක් හෝ වාර්තාවී තිබෙන බව දක්නට නොලැබේ. එබැවින් එහි ඇතුළත්වී තිබෙන වෙනත් කරුණු පමණක් පදනම් කොට ගෙන මේ පිළිබඳ තීරණවලට එළැඹීමට සිදුවී ඇති බව පෙනේ. මේ සම්බන්ධයෙන් අතිශය අනර්ඝ විස්තරයක් මෙන්ඩිස් ඉංග්‍රීසි භාෂාවෙන් ගෙනහැර දක්වා ඇති හෙයින් ඔහුගෙන් උපුටා ගත් එම ඡේදයත් එහි සිංහල පරිවර්තනයත් මෙහි පහත පිළිවෙළින් ගෙනහැර දක්වනු ලැබේ.

> "There is also no definite evidence to fix the date of Mahavamsa Tika. It cannot be earlier than the seventh century AD as king Dathopatissa II is mentioned. On p.294 Mahavamsa Tika mentions the Mahabodhivamsakatha. If this work is the same as the Mahabodhivamsa, the Mahavamsa Tika is later than the tenth century AD. The Pali Thupavamsa, written about the middle of the thirteenth century,

JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

mentions the Mahavamsa Tika, and the author of the Mahavamsa Tika did not know of the later addition to the Mahavamsa (Dipavamsa and Mahavamsa, p.34). The style of the Mahavamsa Tika is quite different from the earlier Pali commentaries, and shows strong influence of Sanskrit. Therefore, Professor Geiger is perhaps correct when he places it between 1000 AD and 1250 AD." (Mendis 1930:19-20).

"මහාවංස ටීකාව රචනා කරන ලද කාලය තීරණය කිරීමට ආධාර වන නිසැක සාක්ෂි කිසිවක් හෝ හමුවන බව නොපෙනේ. එහෙත් මෙහි දෙවන දාඨෝපතිස්ස රජු ගැන සඳහන්වී තිබෙන හෙයින් එය ක්‍රි.ව. හත්වන සියවසට පෙර රචනා කරන ලද කෘතියක් විය නොහැකිය. එමෙන්ම එහි 294වන පිටුවේ මහාබෝධිවංස කථාව නම් කෘතියක් ගැන සඳහන් කොට තිබෙන බැවින් එයින් අදහස් කොට තිබෙන්නේ මහාබෝධිවංසය ගැන නම් මහාවංස ටීකාව දහවන සියවසින් පසුව රචනා කරන ලද කෘතියක් විය හැකිය. දහතුන්වන සියවසේ මැද භාගයෙහිදි රචනා කොට ඇති ථූපවංසයෙහි මහාවංස ටීකාව ගැන කරුණු සඳහන්වී ඇති නමුත් මහාවංසයට පසුව එකතු කොට ඇති කොටස් පිළිබඳව මහාවංස ටීකාවෙහි කතුවරයා විස්තර දැන සිටි බව නොපෙනේ. එමෙන්ම මහාවංස ටීකාවෙහි රචනා ශෛලිය පැරණි අට්ඨකථාවල දක්නට ලැබෙන ශෛලියට වඩා බෙහෙවින් වෙනස් එකක් වන බවත් සංස්කෘත සාහිත්‍යයෙහි දැඩි බලපෑමක් ඊට ඉතා හොඳින් ලැබී තිබෙන බවත් පෙනේ. එබැවින් මහාචාර්ය ගෛගර් මෙය ක්‍රි.ව. 1000-1250 අතර කාලයට අයත් කෘතියක් වියහැකියැයි තීරණය කොට තිබෙන නිගමනය සමහර විට නිවැරදි එකක් විය හැකිය." (Mendis 1930: 19-20).

මෙන්ඩිස් ඉදිරිපත් කොට තිබෙන මෙම විස්තරයට අමතරව වංසත්ථප්පකාසිනියෙන් උපුටා මෙහි ඉහත ගෙනහැර දක්වා ඇති උද්ධෘත පාඨයෙහි ඇතුළත්ව පවත්නා "විදේශ ආධිපත්‍ය භය, දුර්භික්ෂ භය, රෝග භය ආදී අනේකවිධ අන්තරාය බහුල කාලයෙක වුවද...." යනාදි වශයෙන් වන ප්‍රකාශයට අනුව ඇතැම් විට එය චෝළ පාලන සමයෙහිදී රචනා කරන්නට ඇතැයි අනුමාන කළ හැකි වුවත් එකල දුර්භික්ෂ භය හා රෝග භය පැවති බවට වාර්තා කිසිවක් හමුවන බව නොපෙනේ. සත්‍ය වශයෙන්ම දෙවන දාඨෝපතිස්ස හෙවත් හත්ථදාඨගේ (659-667) පාලන කාලයට පසුව, ඊට ආසන්න අවධියකදී නියං හා සාගත භය පිළිබඳව තොරතුරු වාර්තාවී තිබෙන්නේ අවස්ථා දෙකකදී පමණි. ඉන් පළමුවැන්න දෙවන උදය රජුගේ (887-898) කාලයෙහිදීත් දෙවැන්න දඹදෙණියේ දෙවන පරාක්‍රමබාහු (1236-1270) රජුගේ පාලන සමයෙහිදීත් යනුවෙන් ඇතිවී තිබෙන බවට වාර්තා වේ (සිරිවීර 2005: 127-128). එහෙත් ඉන් දෙවන උදය රජුගේ කාලයෙහිදී විදේශාධිපත්‍යය භයක් මෙරට පැවති බව දක්නට නොලැබේ. එසේ වුවත් දඹදෙණියේ දෙවන පරාක්‍රමබාහු රජුගේ පාලන සමයෙහිදී, ක්‍රිව 1215-1255 අතර කාලයෙහි කාලිංග මාඝගේ ආක්‍රමණය සහ ඔහුගේ දුර්දාන්ත පාලනයද, 1247 සහ 1258-1262 අතර අවධියෙහි චන්ද්‍රබානු විසින් සිදු කරන ලද ආක්‍රමණ දෙකද, 1258-1263 අතර කාලයෙහි පාණ්ඩ්‍ය අධිරාජ්‍යයේ සුන්දර පාණ්ඩ්‍ය හා වීර පාණ්ඩ්‍ය යන දෙදෙනාගේ ආක්‍රමණද යනුවෙන් විදේශාධිපත්‍ය භය තුනක් මෙරටට ලැබී තිබෙන බව පෙනේ (ලියනගමගේ 1989: 200-205, 211, 220-225, 234). එපමණක් නොව මෙකල දරුණු නියං සාගතයක් පැවති බවටද සමකාලීන සාහිත්‍යයෙහි තොරතුරු වාර්තාවී තිබෙනු දක්නට ලැබේ. එම නියඟය නිසා සියලු ගස කොළ පිළිස්සී ගොස් ඇති බවත් ඒ වෙනුවෙන් රජු විවිධ ආගමික පුදපූජා මෙකල පවත්වා ඇති බවත් කියනු ලැබේ. නිදසුනක් ලෙස මේ පිළිබඳව මහාවංසයෙහි පහත දැක්වෙන විස්තරය ඉදිරිපත් කොට තිබෙන බව පෙනේ. එනම්:

"කිසි කලක ලක්දිව්හි අවග්‍රහ වශයෙන් සියල්ලවුන් සන්තෘප්තකර හේතු වූ මහා ග්‍රීෂ්මයක් හටගත් කල ශස්‍යයන් මැලවෙන කල ඉක්මිය නොහැකි දුර්භික්ෂ ඇති කල සියලු ලක්දිව් වැසි මහජනයා අතිශයින්

JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

බියපත් කල රජ තෙමේ වූ කලී එකල්හි තුනුරුවන් චෛත්‍ය බෝධීන්ටද මහර්ධි ඇති නාථ මෛත්‍රේය දේවාදී පූජනීය දෙවියන්ටද නන්වැදැරුම් පූජායෙන් සියලු ලක්දිව එක් උතුම් පූජාවක් කරවා පුද පෙරදැරි කොට බික් සඟහු එක්කොට පිරිතුදු බණවා මර්ෂීහුගේ දළදා වහන්සේ වඩාගෙණ නුවර මොනට පැදකුණු කරවා ඉන්පසු ඒ තෙමේ වර්ෂාව වසීවයි මෙසේ අධිෂ්ඨාන කෙළේය." (මහාවංසය 2004: 87; 1-6).

එමෙන්ම දෙවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයෙහිදී ඉතා කැපී පෙනෙන ආකාරයෙහි ශාස්ත්‍රීය ප්‍රබෝධයක් මෙරට ඇතිවී තිබෙන බවද මෙහිදී සිහිපත් කළ යුතුය. කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන ගෞරව නාමයෙන් හැඳින් වූ ප්‍රකට සාහිත්‍ය ධරයෙකු වූ මේ රජතුමා විසින්ම වනවිනිස සන්නය හා විශුද්ධිමාර්ග සන්නය යන කෘතීන් දෙක මෙකල ලියන ලද බව කියනු ලැබේ. එපමණක් නොව ඊට පෙර පැවති දුර්භාග්‍ය සම්පන්න සමයෙහිදී දකුණු ඉන්දියාවේ චෝළ හා පාණ්ඩ්‍ය දේශවලට පළා ගොස් සිටි බහුශ්‍රැත මහතෙරවරු මෙකල යළිත් දිවයිනට කැඳවා ඇති බවටද තොරතුරු වාර්තාවී තිබේ (ලියනගමගේ 1989: 266). එවැනි කරුණුවල ප්‍රතිඵලයක් වශයෙන් සද්ධර්මරත්නාවලිය, පූජාවලිය, සිදත් සඟරාව, එළුසඳැස් ලකුණ, දඹදෙණි කතිකාවත, යෝගාර්ණවය, ප්‍රයෝගරත්නාවලිය, කඳවුරු සිරිත, ථූපවංශය, ධර්මප්‍රදීපිකාව, අමාවතුර, උමංදාව, කර්මවිභාගය, සම්බන්ධචින්තා, පයෝගසිද්ධි, වුත්තෝදය, සුබෝධාලංකාරය, දහම්ගැටය, සීමාලංකාර සංගහ, සික්ඛාපද වලඤ්ජන, සම්බුද්ධ චරිත වණ්ණනා, පජ්ජමධු, සමන්තකූට වණ්ණනා, ජිනචරිතය, රසවාහිනී, අභිධම්මත්ථවිභාවිනී, අභිධම්මත්ථ විකාසිනී, සික්ඛාපද වලඤ්ජන, ලෝකප්පදීපකසාර, සද්ධම්මසංගහ, සද්ධම්මොපායන, සාරසංගහ, උපාසක ජනාලංකාරය, භේසජ්ජමඤ්ජුසා, හත්ථවනගල්ල විහාරවංස, සාරත්ථ සමුච්චය, විනයත්ථ මඤ්ජුසා, සුමංගලප්පසාදනී, විනය සාරත්ථදීපනී, සීමාලංකාර ගන්ධි, මොහච්ඡේදනී, ලීනත්ථදීපනී, සාරත්ථසාලිනී, සාරත්ථ විලාසී, විමතිවිනෝදනී, දෛවඥ කාමධෙනුව, පදසාධන සන්නය, රූපසිද්ධි සන්නය, සුබෝධාලංකාර සන්නය, භේසජ්ජමඤ්ජුසා සන්නය, කුදුසික සන්නය, අභිධානප්පදීපිකා සන්නය, බ්‍රහ්මජාල සූත්‍ර සන්නය, ධම්මපද සන්නය, සූත්‍රනිපාත සන්නය, අටදා සන්නය, ජාතකගාථා සන්නය, විශුද්ධිමාර්ග සන්නය, සද්ධම්මොපායන සන්නය, ප්‍රාතිමොක්ෂ සන්නය, විශුද්ධිමාර්ග සංක්ෂේප සන්නය, සච්චසංඛේප සන්නය, රූපසිද්ධි සන්නය, සම්බන්ධචින්තා සන්නය, සුබෝධාලංකාර සන්නය, සද්ධම්මොපායන සන්නය, වනවිනිස සන්නය, විනය සන්නය, කුදුසික සන්නය, පටිසම්භිදාමග්ග ටීකා, විනයවිනිශ්චය ටීකා, අභිධර්මාවතාර පුරාණ ටීකාව, නාමරූප පරිච්ඡේදක ටීකා, නාමරූපසමාස පුරාණ ටීකාව, රසවාහිනී ටීකා, රූපසිද්ධි ටීකා, සුබෝධාලංකාර ටීකා, හා තවත් පොත්පත් අතිවිශාල සංඛ්‍යාවක් මෙකල රචනා කොට ඇති බවට විශ්වාස කරනු ලැබේ (සුමනජෝති හිමි 2017: 227-354). මෙබඳු පොත්පත් අතුරින් සන්න සහ ගැටපද ස්වරූපයෙහි ග්‍රන්ථ සමූහයක් මේ කාලයෙහිදී වැඩි වශයෙන්ම රචනා කොට තිබෙන බව පෙනේ. බෞද්ධ ධර්ම ග්‍රන්ථ හැදෑරීමට පහසුකම් සැලසීමේ අරමුණින් මෙවැනි ග්‍රන්ථ සම්පාදනය කොට තිබෙන බව දක්නට ලැබේ (සුමනජෝති හිමි 2017: 269). එපමණක් නොව මහාවංසයේ තෙවැනි කොටසත් මේ අවධියෙහිදීම රචනා කොට තිබෙන බවට විශ්වාස කරනු ලැබේ (සෝමතිලක 2022: 158-164; සුමනජෝති හිමි 2017: 138-139, 216, 329-319-320). මේ අනුව දඹදෙණි යුගයෙහිදී ඉතා ඉහළ ශාස්ත්‍රීය ප්‍රබෝධයක් ඇතිවී තිබෙන බවට කිසිදු සැකයක් නැත. එබැවින් මෙම පසුබිම යටතේ මහාවංස ටීකාවත් දඹදෙණි සමයේදී සිටි දෙවන පරාක්‍රමබාහු රජුගේ කාලයෙහිදීම රචනා කරන ලද කෘතියක් විය හැකියැයි අනුමාන කළ හැකිය.

එහෙත් මෙහි ඉහත පැහැදිලි කොට ඇති පරිදි මහානාම තෙරුන් වහන්සේ ගැන සඳහන් වන ප්‍රකාශය මහාවංස ටීකාවෙහි සමාරම්භයෙහි නොව එහි අවසානයේ යොදා ඇති එකක් වන බැවින් එය පසු කලෙක අලුතින් ලියා ඊට එකතු කොට ඇති විස්තරයක් විය හැකියැයි කියා වුවද කෙනෙකුට ඉතා පහසුවෙන්ම අනුමාන කළ හැකිය. එබැවින් මහාවංස ටීකාවෙහි නිවැරදි කාලනිර්ණය දැන ගැනීමෙන් පසුව වුවද මෙම අලුත් කොටස ඊට කවර කලෙක එකතු කොට තිබේදැයි යන්න කිසිසේත් නිවැරදිව අවබෝධ කොට ගත හැකි බව නොපෙනේ. මෙපරිද්දෙන් රචනා කරන ලද කාලය පිළිබඳව නිශ්චිත තොරතුරු කිසිවක් හෝ වාර්තාවී නැති නමුත් යටත් පිරිසෙයින් දේවානම්පිය

තිස්ස රජුගේ පාලන සමයෙන් වසර දහසකට අධික කාලයක් ගතවීමෙන් පසුව ලියා ඇති බවට නිසැක වංසත්ථප්පකාසිනිය මේ පිළිබඳව ගෙනහැර දක්වා ඇති කරුණු කෙතරම් නිවැරදි ආකාරයකට සඳහන් කොට තිබෙන්නේදැයි යන්න කිසිවෙකුටත් පහසුවෙන් තීරණය කළ හැකි තත්ත්වයක පවත්නා බව දක්නට නොලැබේ. එපමණක් නොව වංසත්ථප්පකාසිනිය රචනා කිරීමට කෙතරම් කාලයකට පෙර අවධියකදී මහාවංසය රචනා කොට තිබෙන්නේදැයි යන්න වටහා ගැනීමට ආධාර වන කරුණු කිසිවක් හෝ මේ වන විට ශේෂව පවත්නා බවද නොපෙනේ. එබැවින් මහාවංස ටීකාවෙහි සඳහන්වී තිබෙන, එකල දීඝසන්ද පිරිවෙනෙහි වාසය කරමින් මහාවංසය රචනා කරන ලද්දේයැයි කියනු ලබන, මහානාම හිමියන් කුමන කාලයක විසූ තෙරුන් වහන්සේ නමක්දැයි යන්න පවා නිවැරදි ලෙස තීරණය කිරීම කිසිසේත් පහසු කටයුත්තක් නොවන බව අමුතුවෙන් සඳහන් කළ යුතු නැත.

එහෙත් මහාවංසය යනු මහානාම තෙරුන් වහන්සේගෙන් පසුව පවා අඛණ්ඩව ලියන ලද ග්‍රන්ථයක් වන බැවින් උන්වහන්සේ කවරෙකුදැයි වටහා ගැනීම සඳහා එහි මුල් කොටසින් පසුව රචනා කොට තිබෙන මහාවංසයේ දෙවන කොටසෙහි, එනම් චූලවංසය නමින් කාලයක් වැරදි ආකාරයකට හඳුන්වා ඇති ග්‍රන්ථයෙහි, ඇතුළත්වී තිබෙන සඳහන් දෙකක් මෑත කාලීන උගතුන් විසින් ප්‍රයෝජනයට ගෙන ඇති බව දක්නට ලැබේ. මහාවංසයේ එම දෙවන කොටසට ඇතුළත්ව ඇති තිස්අටවන පරිච්ඡේදයේ දහසයවන හා දාහත්වන ගාථාවල දීඝසන්ද විහාරයෙහි වාසය කළ, ගිහි ඥාතිත්වයෙන් තම මවගේ සහෝදරයා හෙවත් සිය මාමා වූ තෙරුන් වහන්සේ කෙනෙකු සමීපයෙහි සතුරන්ගෙන් ආරක්ෂාවීම සඳහා ධාතුසේන කුමරු (455-473) කාලයක් වාසය කොට ඇති බවට වාර්තාවී තිබෙන්නේයැයි සලකා එම අවස්ථාව මේ සඳහා එක් සාක්ෂියක් වශයෙන් ඇතැමෙකු භාවිත කොට ඇති බව පෙනේ (මහාවංශය 1932: 38; 16-17). මහාවංසයෙහි මුල්ම ඉංග්‍රීසි පරිවර්තනය ප්‍රකාශයට පත් කරන ලද ජෝර්ජ් ටර්නර් එහි දෙවන කොටසෙහි සඳහන්ව ඇති එම විස්තරය අනුව ගොස් මහාවංස රචකයා වූ මහානාම හිමි සහ ධාතුසේන කුමරු හදාවඩා ගත් මහානාම හිමි යනු එක් අයෙකුම වන බවට මෙසේ මුල් වරට සඳහන් කොට ඇති බව දක්නට ලැබේ (Mahawanso 2016: liv-lv).

එහෙත් ස්නීඩර් 1891 වර්ෂයෙහිදී Der Commentar und die textuberliferung des Mahavamsa නම් ජර්මන් බසින් පළ කොට තිබෙන කෘතියෙහිදීත් (Snyder 1891), රීස් ඩේවිඩ්ස් 1905 වර්ෂයෙහිදී Dipavamsa und Mahavamsa und die geschichtliche ueberlieferung in Ceylon von Wilhelm Geiger නමැති ඉංග්‍රීසි බසින් ප්‍රකාශයට පත් කොට ඇති ග්‍රන්ථ විවේචනයෙහිදීත් ටර්නර්ගේ එම හඳුනා ගැනීම ප්‍රශ්න කොට තිබෙන බව දක්නට ලැබේ (Davids 1905: 391-395). මේ අතුරින් ඩේවිඩ්ස්ගේ ප්‍රකාශයෙහි ඒ පිළිබඳව මෙපරිද්දෙන් කරුණු පැහැදිලි කොට ඇති බව පෙනේ. මහානාම යනු බුදුන් වහන්සේගේ සමීපතම ඥාති සොහොයුරකු වූ සහ පසුව උන්වහන්සේගේ මුල්ම ශ්‍රාවකයන්ගෙන් කෙනෙකු වූ භික්ෂූන් වහන්සේ නමකි. ක්‍රිස්තියානි ආගමෙහි එන ජෝන් හෝ පීටර් යන නම් මෙන් බුදුසමයෙහි සඳහන් වන මහානාම යනුද පොදු නාමයක් වන බවට සැකයක් නැත. මහාවංසය රචනා කරන ලද කාලය ලෙසට පිළිගනු ලබන අවධියෙහි මහානාම නමින් සිටි හිමිවරු දෙදෙනකු ගැන තොරතුරු අසන්නට ලැබේ. එහෙත් ටර්නර් ඒ දෙදෙනා පිළිබඳව සාවද්‍ය ආකාරයකට කරුණු වටහා ගෙන තිබෙන බව පෙනේ. ගෛගර් නිවැරදිව වටහා ගෙන ඇති පරිදි මේ දෙදෙනාම එක් අයෙකු නම් ඉන් එක් අවස්ථාවක සඳහන් කොට ඇති එම තෙරුන් වහන්සේ වසර සියයක් හෝ ඊටත් වඩා වැඩි වයෝවෘද්ධ තත්ත්වයක සිටි භික්ෂුවක් විය යුතු බැවින් ඒ දෙදෙනා එක් අයෙකු වශයෙන් හඳුනා ගැනීමට අපහසු වේ. එබැවින් ගෛගර් මේ දෙදෙනාම එක් අයෙකු නොව දෙනෙකු වශයෙන් හඳුනා ගත හැකි බවත් ඔවුනතුරින් දෙවන වර සඳහන් කොට ඇති තෙරුන් වහන්සේ මහාවංසයේ කර්තෘවරයා විය හැකි බවත් විශ්වාස කොට ඇති බව පෙනේ. උන්වහන්සේ වාසය කළේ ක්‍රි.ව. පස්වන සියවසේ අග භාගයෙහිදීය. ටර්නර්ගේ මෙම උපකල්පනය පිළිගැනීමට අසීරු එකක් වශයෙන් නිතර ප්‍රශ්න කොට ඇති නමුත් මාගේ දැනුමට අනුව මෙම ගැටලුව නිරාකරණය කර ගැනීමට සමත් වූයේ ගෛගර් පමණි. කිසිදු සැකයකින් තොරව ගෛගර්ගේ නිගමනය දැන් සියලු දෙනා විසින්ම පිළිගනු ඇත (Davids 1905: 391-392). යනුවෙන් රීස් ඩේවිඩ්ස් මේ පිළිබඳව ඉතා විශ්වාසයෙන් යුතුව කරුණු විස්තර කොට ඇති බව පෙනේ. එහෙත් සත්‍ය

JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

වශයෙන්ම ටර්නර් සහ ගෛගර් පමණක් නොව ඩේවිඩ්සද් මහාවංසයෙහි සඳහන් වන ඇතැම් කරුණු සම්බන්ධයෙන් සාවද්‍ය තීරණවලට එළැඹී තිබෙන බව මෙහි පහත සාකච්ඡා කරනු ලබන කරුණුවලින් වටහා ගත හැකිය.

ඉතා ප්‍රවේශමෙන් පරීක්ෂා කොට බලන විට, එවකට මෙරට පාලනය කළ "දමිළ සතුරන්ගෙන්" ධාතුසේන කුමරු ආරක්ෂා කරගනු පිණිස රහසිගත ලෙස ඔහු හදාවඩා ගෙන ඇති තෙරුන් වහන්සේ මහානාම නමැති භික්ෂුවක් වූ බවට මහාවංසයෙහි කිසිදු තැනෙක හෝ සඳහන්වී ඇති බව දක්නට නොලැබේ. ඒ වෙනුවට මහාවංසයේ පාලි සංස්කරණයේ "මාතු සොදරියෙ තෙසං සද්ධො පබ්බජ්ජ වත්තති දීඝසන්දකතාවාසෙ ධාතුසෙනොපි මාණවො" යනුවෙන්ද (මහාවංසෙ 1877: 38;16; ඌනපූරණසහිතො මහාවංසො 1959: 38;16-17; Culavamsa 1925: 38;16-17), සිංහල පරිවර්තනයෙහි "උන් මෑණියන් සොහොවුරු සැදැ හැත්තෙක් පැවිදිව දික්සඳ සෙනෙවියා පිරිවෙණ වෙසෙයි. ධාතුසෙන තරුණ තෙමේද උන්වහන්සේ වෙත පැවිදි විය" යනුවෙන්ද මෙම භික්ෂූන් වහන්සේ "දීඝසන්ද" හෝ "දික්සඳ සෙනෙවියා" කළ විහාරයෙහි හෝ වාසය කළ තෙරුන් වහන්සේ කෙනෙකු බවට පමණක් මහාවංසයෙහි වාර්තා කොට තිබෙන බව ඉතා හොඳින් පැහැදිලි වේ (මහාවංශය 1932: 38; 16-17). ගෛගර්ගේ ඉංග්‍රීසි පරිවර්තනයෙහිත් එය "දීඝසන්ද විහාරය" යනුවෙන් පමණක් වන පරිදි පරිවර්තනය කොට තිබෙන බව දක්නට ලැබේ (Culavamsa 1953: 38;16-17). එබැවින් එම තෙරුන් වහන්සේ මහානාම නමැත්තෙකු වූ බවට හෝ උන්වහන්සේගේ පෞද්ගලික සංඥා නාමය කුමක් වූවේදැයි යන්න ගැන හෝ කිසිවක් එහි සඳහන්වී නැති නමුත් මහාවංසයේ මුල් කොටස ධාතුසේන රජුගේ කාලයෙහිදී වාසය කළ මෙකී තෙරුන් වහන්සේ විසින් රචනා කරන ලදැයි සමහර උගතුන් මෙලෙස කිසිදු පදනමකින් තොරව අතිශය සාවද්‍ය අන්දමින් විශ්වාස කොට තිබෙන බව පෙනේ.

එපමණක් නොව ධාතුසේන රජුගේ කාලයට සම්බන්ධ කොට මහාවංසයෙහි සඳහන්කර තිබෙන තවත් පාඨයක්ද ටර්නර් මේ සඳහා සාක්ෂියක් වශයෙන් සැලකිල්ලට ගෙන ඇති බව දක්නට ලැබේ (Mahawanso 2016: liv-lv). එම පාඨයෙහි "මහාමහින්දථෙරස්ස කාරෙත්වා පටිබිම්බකං - ථෙරස්සා'ලාහනං නෙත්වා කාතුං පූජං මහාරහං - දත්වා සහස්සං දීපෙතුං දීපවංසං සමාදිසි" යනුවෙන් පාලි බසින්ද "මිහිඳු මහතෙරුන් පිළිමය කරවා ආදාහන ස්ථානයට වඩා ගෙන ගොස් තෙරුන්ට මාහැඟි පූජා කරනු පිණිස දහසක් දී දීපවංසය ප්‍රකාශ කරන්නට අණ කළේය" යනුවෙන් සිංහල භාෂාවෙන්ද ප්‍රකාශ වන අදහසක් ඇතුළත්ව තිබේ (ඌනපූරණසහිතො මහාවංසො 1959: 38;58-59; මහාවංශය 1932: 39; 57-58). එහි සඳහන් වන දීපවංසය නම් පදය මහාවංසය වෙනුවෙන් භාවිත කොට ඇති අපර නාමයක් ලෙසට ටර්නර් සලකා තිබෙන බව ඔහුගේ පාදක සටහනක ගෙනහැර දක්වා ඇති විස්තරයකින් හොඳින් පැහැදිලි වේ (Mahawanso 2016: iv). ෆ්ලීට් වැනි පූර්වකාලීන උගතුන්ද විජේතුංග වැනි මෑත කාලීන රචකයන්ද මෙයින් මහාවංසය පිළිබඳවම අදහස් කොට ඇති බවට විශ්වාස කොට ඇති නමුත් (Fleet 1909: 5; The Mahavamsa 1950: xi-xii; විජේතුංග 2012: 5-6) දීපවංසය යනු මහාවිහාර සම්ප්‍රදායටම අයත් වන, මහාවංසයට පෙර රචනා කොට ඇති, කර්තෘ අඥාත වෙනත් භික්ෂුවක් විසින් ලියන ලද ග්‍රන්ථයක් වන බවට කිසිදු සැකයක් නැත. එමෙන්ම දීපවංසය නමැති සංඥානාමය මහාවංසය හැඳින්වීම සඳහා කවර කලෙකවත් භාවිතයට ගෙන තිබෙන බවට කිසිදු මූලාශ්‍රයකින් හෝ තහවුරු වන බවද නොපෙනේ. ඒ වෙනුවට මහාවංසයේ සෑම පරිච්ඡේදයකම පාහේ අවසානයෙහි එය මහාවංසය නමින්ම හඳුන්වා තිබෙන බව දක්නට ලැබේ.

එපමණක් නොව එම ප්‍රකාශයෙහි ඇතුළත්ව ඇති දීපවංසය යනු එනමින්ම හඳුන්වන ග්‍රන්ථය වන බවත් එබැවින් ධාතුසේන රජුගේ කාලයෙහිදී වෙනත් කෘතියක් නොව දීපවංසය සජ්ඣායනා කරන ලද ආකාරය ගැනම එහි සඳහන්වී තිබෙන බවත් බොහෝ උගතුන් විශ්වාස කොට ඇති බව පෙනේ (වික්‍රමසිංහ 1965: 3-4). දීපවංසයෙහි එන විස්තර මෙලෙස මතක තබාගෙන සජ්ඣායනා කොට තිබෙන ඒවා බව එහි ඇතුළත්වී ඇති ධාරණ පාඨවලින් හෙවත් උද්දාන ගාථාවලින්ද ඉතා හොඳින් පැහැදිලි වේ. නිදසුනක් ලෙස එහි දාහත්වන පරිච්ඡේදයෙහි තුන්වන හා හතරවන ගාථා හුදු නාමපද සමූහයකින් පමණක්ම

JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

සමන්විත එබඳු ධාරණ පාඨ වන බව පෙනේ (දීපවංසය 1980: 17; 3-4). එහෙත් මහාවංසයෙහි එබඳු ධාරණපාඨ කිසිවක් හෝ ඇතුළත්ව තිබෙන බව දක්නට නොලැබේ. එමතුද නොව දීපවංසය සජ්ඣායනා කරන ලද බවට එහි සඳහන්ව ඇති නමුත් එය එනමින් වූ අලුත් ග්‍රන්ථයක් රචනා කළ බවට වන විස්තරයක් නොවන බවද ඉතා පහසුවෙන්ම වටහා ගත හැකිය. මේ අනුව ධාතුසේන රජුගේ කාලයට සම්බන්ධ කොට මහාවංසයේ සඳහන් කර ඇති මේ ප්‍රකාශය එම රජුගේ කාලයෙහිදී මහාවංසය ලියන ලද බවට සාක්ෂියක් වශයෙන් කිසිසේත් සැලකීමට නොහැකි වන බවත් එය නිසැකවම ක්‍රි.ව. හතරවන සියවසෙහිදී රචිත කෘතියක් ලෙසට විශ්වාස කෙරෙන දිවයිනේ පැරණිතම වංශකථාව වන දීපවංසය ගැන කෙරෙන සඳහනක්ම වන බවත් ඉතා හොඳින් පැහැදිලි වේ.

එහෙත් මහාවංසයෙහි ඉන් අනතුරුව එන තිස්නවවන පරිච්ඡේදයෙහි පාලි භාෂාවෙන් "පබ්බතන්තු විහාරං සො කත්වා ථෙරස්ස දාපයි මහානාමසනාමස්ස දීඝසන්ද විහාරකෙ" යනුවෙන්ද (මහාවංසෙ 1877: 39; 42; මහාවංසෙ, 1908: 39;42; ඌනපූරණසහිතො මහාවංසො 1959: 39;42), එහි සිංහල පරිවර්තනයෙහි " හේ මේ එම සීගිරිගල විහාරයක් කොට දික්සඳ සෙනෙවියා කළ විහාරයෙහි මහානාම නම් තෙරුන්ට දෙවී" යනුවෙන්ද (මහාවංශය 1932: 39; 42-43), සීගිරි පර්වතයෙහි ඉදිකළ විහාරයක් පළමුවන මොග්ගල්ලාන (491-508) රජු විසින් දීඝසන්ද විහාරයේ වාසය කළ මහානාම නම් තෙරුන් වහන්සේට පූජා කරන ලද බවට වාර්තා කොට තිබේ. එහෙත් ගෛගර් පඬිවරයාගේ ඉංග්‍රීසි සංස්කරණයෙහි එම පබ්බතාරාමය "දීඝාසන විහාරකෙ" යනුවෙන් දීඝාසන විහාරය ලෙසට සඳහන් කොට තිබෙනු දක්නට ලැබේ. ඔහු විසින් භාවිතා කරන ලද ඇතැම් පිටපත්වල මෙම පදය " දීඝාන" යනුවෙන් යොදා ඇති බවද ගෛගර් එහි අධෝලිපියක් මඟින් කරුණු පැහැදිලි කොට ඇති බව පෙනේ (Culavamsa 1925: 39; 42-43). එමෙන්ම ඊට අදාළව එහි ඉංග්‍රීසි පරිවර්තනයෙහි ඔහු ඇතුළත් කොට ඇති වෙනත් අධෝලිපියක එම "දීඝාසන විහාරය" ඉහත සඳහන් කරන ලද "දීඝසන්ද" සෙනෙවි විසින් කළ විහාරය වීමට බොහෝ සෙයින් ඉඩකඩ ඇති බවද පැහැදිලි කොට තිබේ (Culavamsa 1953: 48, 361).[3] එපමණක් නොව මේ පිළිබඳව තවදුරටත් කරුණු ගෙනහැර දක්වා ඇති ගෛගර් ඊට පටහැනිව 1877 වර්ෂයෙහිදී ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාව දෙදෙනා විසින් සංස්කරණය කොට පළකර ඇති මහාවංසයේ දෙවන කාණ්ඩයෙහි එම සංඥානාමය ඔවුනට අවශ්‍ය පරිදි වෙනස් කොට යොදා තිබීම ප්‍රශ්න සහගත කරුණක් වන බවද පෙන්වා දී තිබේ (Culavamsa 1925: 48, 361). දීඝාසන හෝ දීඝාන නමැති නාමය දීඝසන්ද යනුවෙන් වෙනස් කොට, තම අවශ්‍යතාවයට අනුව වැරදි ආකාරයකට මහාවංස පාලි සංස්කරණයේ සහ එහි සිංහල පරිවර්තනයේ මෙම උගතුන් දෙදෙන යොදා තිබෙන බව ගෛගර් මෙයින් ඉතා හොඳින් හඟවා ඇති බව පෙනේ. ගෛගර්ගේ මෙම ප්‍රකාශය අගතියෙන් තොර ඉතා නිවැරදි එකක් බව ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාව දෙදෙනාගේ මහාවංස පාලි සංස්කරණයෙහි එය "දීඝාසන" යනුවෙන් එහි අධෝලිපියක සඳහන් කොට තිබීමෙන් හොඳින් පැහැදිලි වේ (මහාවංසෙ 1908: 39; 42). එපමණක් නොව මහාවංසයේ පැරණි පුස්කොළ පොත්වල සඳහන්වී තිබෙන පෙළ සමග සසඳන විටද ගෛගර්ගේ අදහස නිවැරදි එකක් වන බව ඉතා හොඳින්ම පැහැදිලි වේ.[4] එබැවින් එම සංඥානාමය පාලි හා සිංහල මහාවංස සංස්කරණයන්හි හෝ පරිවර්තනයන්හි " දීඝසන්ද විහාරයේ," "දික්සඳ සෙනෙවියා කළ විහාරයේ," "දීඝාසන විහාරයේ" සහ "දීඝාන විහාරයේ" යනුවෙන් එකිනෙකට වෙනස් ආකාරයෙන් සඳහන් කොට ඇති නමුත් එවැනි නාමපදයක් මෙසේ විවිධාකාර අන්දමට කිසිවෙකුටත් ගෙනහැර දැක්විය හැකිදැයි යන්න බෙහෙවින් සැක සහිතය. සත්‍ය වශයෙන්ම තම පෞද්ගලික කැමැත්තට හෝ අවශ්‍යතාවයට අනුව හෝ එසේ ගෙනහැර දැක්වීම මුළුමනින්ම අශාස්ත්‍රීය, පිළිගැනීමට කිසිසේත්ම අසීරු ක්‍රමයක් වන බවට නිසැකය. මේ නිසා ඉහත සඳහන් කළ සංස්කරණ කිහිපය අතුරින් පැරණිතම ලේඛනය වන පාලි මහාවංසයේ විස්තර කොට තිබෙන "දීඝාසන

[3] පොල්වත්තේ බුද්ධදත්ත හිමියන්ද මෙම පදය දීඝසන්ද යනුවෙන් යොදා ඇති බව මෙහි ඉහත උපුටා දක්වා තිබෙන විස්තරයෙන් පැහැදිලි වේ.

[4] පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයෙහි ඇති අංක 277190, 277191 සහ 277587 දරන පුස්කොළ පොත්.

JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

විහාරය” යනුවෙන් යොදා ඇති පදය කෙරෙහි පමණක් මෙහිදී විශ්වාසය තැබීම වඩා යෝග්‍ය වන බව පෙනේ.

මෙපරිද්දෙන් මහාවංසයේ දෙවන කොටසෙහි ධාතුසේන සහ ඔහුගේ කනිටු පුත් මොග්ගල්ලාන යන රජවරු දෙදෙනාගේ පාලන කාලයනට සම්බන්ධ කොට පිළිවෙළින් දීඝසන්ද විහාරයෙහි සිටි නම සඳහන් නොවන තෙරුන් වහන්සේ කෙනෙකුත්, දීඝාසන විහාරයෙහි සිටි මහානාම නම් තෙරුන් වහන්සේ කෙනෙකුත් යනුවෙන් තෙරවරු දෙදෙනෙකු ගැන තොරතුරු සඳහන්වී ඇති නමුත් එම රජවරු දෙදෙනා අතර වසර පනහක හෝ හැටක පමණ කාල පරතරයක් දක්නට ලැබෙන හෙයින් සමහර විට එසේ වාර්තා කොට තිබෙන්නේ එකම තෙරුන් වහන්සේ කෙනෙකු ගැන විය හැකියැයි ඇතැමුන් අනුමාන කොට තිබෙනු දක්නට ලැබේ (Mahawanso 2016: lv; Fleet 1909: 5; විජේතුංග 2012: 5-6). එහෙත් එයද සාක්ෂි සහිතව නිසැකවම සනාථ වන අදහසක් නොවන බව ඉහත විස්තරයෙන් ඉතා හොඳින් පැහැදිලි වේ. එබැවින් සිය මූලාශ්‍රය පිළිබඳව කිසිවක් සඳහන් කොට නැති නමුත් බොහෝ විට ගෛගර් හෝ රීස් ඩේවිඩ්ස් අනුව හෝ ගොස් ඇති බවට සිතිය හැකි ලක්ෂ්මන් පෙරේරා “ චූලවංසයේ සඳහන් කරන ලද මහානාම හිමියෝ ඉතා මහලු කෙනෙක් වූහ.” යනුවෙන් මේ සම්බන්ධයෙන් සිදුකර ඇති ප්‍රකාශය පවා පදනම් විරහිත එකක් විය හැකි බව ඉතා පහසුවෙන්ම තීරණය කළ හැකිය (පෙරේරා 1964: 49).

එසේ වුවත් ඉහත සඳහන් කළ ප්‍රකාශන කෙරෙහි හෝ මහාවංසයෙහි එන එම විශේෂ අවස්ථා දෙක කෙරෙහි හෝ කිසිදු අවධානයක් යොමු කොට නැති පශ්චාත්කාලීන උගතුන් ටර්නර්ගේ කාලයෙහි සිට මෙරට ජනප්‍රියවී ඇති විස්තර පමණක් සැලකිල්ලට ගෙන මේ තෙරුන් වහන්සේ මහානාම හිමි නමින්ම මහාවංසයෙහි සඳහන් කොට ඇති බවට විශ්වාස කර තිබෙනු දක්නට ලැබේ (පෙරේරා 1964: 49; ඉලංගසිංහ 2003: 7). එවකට ලංකා විශ්වවිද්‍යාලයෙහි සිටි කීර්තිමත් ඉතිහාසඥයෙකු වූ ලක්ෂ්මන් පෙරේරා ගෙනහැර දක්වා ඇති ප්‍රකාශයක් මේ සඳහා නිදසුනක් වශයෙන් සැලකිය හැකිය. “මහානාම නම් හිමිපාණ කෙනෙකුන් ඒ විහාරයෙහි විසූ බවත් උන්වහන්සේ ධාතුසේන රජුගේ මයිලණු කෙනෙකු බවත් ධාතුසේන කුමරු පැවිදිව සිටියේ උන්වහන්සේ ළඟ බවත් චූලවංසයේ සඳහන් වෙයි” යනුවෙන් ඔහු මේ පිළිබඳව කරුණු විස්තර කොට තිබෙනු දක්නට ලැබේ (පෙරේරා 1964: 49; The Mahavansa 1909; Law 1947). ලංකා ඉතිහාසය පිළිබඳව මේ දක්වා රචනා කොට ඇති විශිෂ්ටතම සංග්‍රහය ලෙසට තවමත් පහසුවෙන් සැලකිය හැකි ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය නම් ග්‍රන්ථයේ පළවී ඇති මෙම අදහස ඊට පසු කාලයෙහිදී තවත් බොහෝ ඉතිහාසඥයන් විසින්ද කිසිදු පරීක්ෂාවකින් තොරව එපරිද්දෙන්ම භාවිතයට ගෙන තිබීම නිසා එය තවමත් ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ මුල්බැස ගෙන ඇති මතයක් බවට පත්වී තිබෙන බව පෙනේ. නිදසුනක් ලෙස ලක්ෂ්මන් පෙරේරා පමණක් නොව ලංකා විශ්වවිද්‍යාලයේ මුල් අවධියෙහි සේවය කොට ඇති බොහෝ ඉතිහාසඥයන්, ජෝර්ජ් ටර්නර් විසින් මුල්වරට ඉදිරිපත් කොට ඇති ඉහත සඳහන් කරන ලද ප්‍රකාශය එපරිද්දෙන්ම පිළිගෙන තිබෙන බව දක්නට ලැබේ. සිරිමා වික්‍රමසිංහ විසින් “ක්‍රි.ව. හයවැනි සියවසේදී පමණ මහාවිහාර නිකායික භික්ෂුවක් වූ මහානාම හිමියන් අතින් රචිත මහාවංසය” යනුවෙන් කර ඇති ප්‍රකාශයෙන්ද (වික්‍රමසිංහ 1965: 4), “ නිශ්චිතවම නිගමනය කළ හැක්කේ එක්කෝ ධාතුසේන රජුගේ කාලයෙහිදී නැතහොත් පළමුවන මොග්ගල්ලාන රජුගේ කාලයෙහිදී මහානාම හිමියන් විසින් මහාවංසය රචනා කරන ලද බවයි” යනුවෙන් ඉන්ද්‍රකීර්ති සිරවීරයන් ගෙනහැර දක්වා ඇති විස්තරයෙන්ද මේ බව ඉතා හොඳින් වටහා ගත හැකිය (සිරිවීර 2012: 10; සිරිවීර 2001: 16). එම කිහිප දෙනා පමණක් නොව ජෝර්ජ් ටර්නර් මුල්වරට ඉදිරිපත් කොට ඇති එම අදහස නිවැරදි එකක් විය හැකි යැයි විජේතුංග වැනි මෑත කාලීන ඉතිහාස රචකයන්ද ඉතා දැඩි ලෙස විශ්වාස කොට තිබෙන බව දක්නට ලැබේ (විජේතුංග 2012: 6). ඊට අමතරව මහාවංසය පිළිබඳව මෑත භාගයෙහිදී ඉංග්‍රීසි භාෂාවෙන් විශාල කෘතියක් පළ කොට ඇති ආනන්ද ගුරුගේ පවා මේ ග්‍රන්ථය “ක්‍රිස්තු වර්ෂයෙන් හය වැනි ශතවර්ෂයේදී ලියන ලද්දේ මහානාම නම් ව්‍යක්ත බෞද්ධ භික්ෂුව විසිනැයි” පිළිගෙන තිබෙන බව පෙනේ (මහාවංසය 2007: ප්‍රස්තාවනාව). ප්‍රාථමික මූලාශ්‍ර කෙරෙහි අවධානය යොමු නොකොට ද්විතීය මූලාශ්‍ර කෙරෙහි ඔවුන් ප්‍රමාණය ඉක්මවා විශ්වාසය තැබීමෙන් මෙම වරද සිදුවී තිබෙන බවට කිසිදු සැකයක් නැත.

JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

එහෙත් මෙලෙස ඇතැම් උගතුන්ගේ විශේෂ අවධානයට ලක්වී ඇති මෙම තෙරුන් වහන්සේලා දෙදෙනාගෙන් කවරෙකු හෝ මහාවංසය රචනා කිරීමට සම්බන්ධවී තිබෙන බවට එම අවස්ථා දෙකෙන් එක් තැනෙකදී වත් සඳහන් කොට නැති බැවින් එය ධාතුසේන රජුගේ හෝ මොග්ගල්ලාන රජුගේ හෝ පාලන කාලයෙහිදී රචනා කොට තිබෙන බව නිසැකවම තහවුරු වන කරුණක් බව නොපෙනේ. එමෙන්ම දික්සඳ සෙනෙවිරදුන් විසින් කරවන ලද “මහපිරිවෙන් වැසි” යනුවෙන් එම තෙරුන් වහන්සේ පිරිවෙනක වාසය කළ බවට මහාවංස ටීකාවෙහි සඳහන් කොට ඇති නමුත් මෙහි අවධානයට ලක්වුණු තෙරුන් වහන්සේ “දීඝසන්ද විහාරයෙහි” හෝ “දීඝාසන නම් විහාරයෙහි” හෝ වාසය කළ බවට පමණක් මහාවංසය වාර්තා කොට තිබෙන බවද පෙනේ. එබැවින් මහාවංසයෙහි දෙවන කාණ්ඩයේ මොග්ගල්ලාන රජුගේ කාලයෙහිදී විසූ මහානාම නම් තෙරුන් වහන්සේ කෙනෙකු ගැන සඳහන්වී ඇති පමණින්ම එම විස්තරය මහාවංසයේ මුල් කාණ්ඩයෙහි කතුවරයා පිළිබඳව කෙරෙන සඳහනකැයි සිතීමට තරම් කිසිදු සාධාරණ පදනමක් පවත්නා බව නොපෙනේ (Davids 1905: 391-395; Mendis 1950: 306). සත්‍ය වශයෙන්ම මහාවංසයේ හෝ වෙනත් ග්‍රන්ථයක හෝ සඳහන්වී නොමැති මහානාම නමින් සිටි තවත් භික්ෂූන් වහන්සේලා කොපමණ සංඛ්‍යාවක් එකල අනුරාධපුරයෙහි වාසය කරන්නට ඇතිදැයි යන්න සිතීමෙන්ම මෙහි යථා ස්වභාවය ඉතා පහසුවෙන් වටහා ගත හැකි වනු ඇත. ඉහත සඳහන් කළ පරිදි, රීස් ඩේවිඩ්ස්ද පෙන්වා දී තිබෙන ආකාරයට මහානාම යනු පොදු භික්ෂු නාමයක් වන බවට නිසැකය. එමෙන්ම මෙහි පසුව විස්තර කොට ඇති ආකාරයට අනුරාධපුර යුගයේ මධ්‍ය භාගයෙහිදී මහානාම නමින් හඳුන්වා ඇති භික්ෂූන් වහන්සේලා කිහිප දෙනෙකුම සිටි බවට තොරතුරු වාර්තාවී තිබීමෙන් මේ තත්ත්වය තව දුරටත් සංකීර්ණ වන බව පෙනේ.

එසේ වුවත් ඉහත සඳහන් කරන ලද අවස්ථා දෙකෙන් පළමුවන මොග්ගල්ලාන (491-508) රජුගේ කාලයෙහිදී වාසය කොට තිබෙන මහානාම නම් හිමි මහාවංසයේ මුල් කොටස රචනා කරන්නට ඇතැයි බෙහෙවින් සැක සහිත ආකාරයකට, අතිශය අනුමාන වශයෙන් පමණක් සැකකළ හැකි තත්ත්වයක් පවත්නා බැවින් ක්‍රි.ව. පස්වන සියවසේ අග භාගයෙහිදී සහ හයවන සියවසේ මුල් භාගයෙහිදී සිටි, මහාවිහාරයට අනුබද්ධ ආයතනයක වාසය කළ එම තෙරුන් වහන්සේ විසින් එය සංග්‍රහ කරන්නට ඇතැයි සිතිය හැකිය. එහෙත් මහාවංසයේ සඳහන් වන මෙම මහානාම තෙරුන් වහන්සේ සහ වංසත්ථප්පකාසිනියෙහි සඳහන් වන මහානාම තෙරුන් වහන්සේ යනු එක් අයෙකුමද යන්න අවිනිශ්චිත වන හෙයින් මේ අදහස පවා බෙහෙවින්ම සැක සහිත එකක් වන බවට නිසැකය. ඒ හැරුණු විට මහාවංසයෙහි රචකයා පිළිබඳව සඳහන් වන්නේයැයි අනුමාන වශයෙන් හෝ සිතිය හැකි වෙනත් විස්තර කිසිවක් පැරණි මූලාශ්‍රයන්හි ඇතුළත්ව නැති බවත් එබැවින් එහි කතුවරයා ගැන මීට වඩා වැඩි යමක් කීමට කිසිවෙකුටත් ඉඩකඩ නොසැලසෙන බවත් පෙනේ. එපමණක් නොව වංසත්ථප්පකාසිනියෙහි සඳහන් වන විස්තරයට අනුව මහාවංසයේ කතුවරයා මහානාම නමැති තෙරුන් වහන්සේ කෙනෙකු වූවේයැයි මොහොතකට හෝ විශ්වාස කළ හැකි වුවද උන්වහන්සේ මහාවංසය රචනා කරන ලද්දේ කවර කලෙකදැයි කිසිදු මූලාශ්‍රයක හෝ සඳහන්ව නැති බැවින් මේ තොරතුර කිසිසේත් මහාවංසයෙහි කාලනීර්ණය තීරණය කිරීමට තරම් උපකාරී වන සාධකයක් වන බව නොපෙනේ.

එසේ වුවත් අනුරාධපුර දෘෂ්ටිකෝණයෙන් ලියා ඇති මහාවංසයේ මුල්ම කොටසෙහි “මෙහි” යන සිංහල අර්ථය සහිත “ඉධ” නම් පාලි පදය නිතර භාවිත කොට ඇති බැවින් මෙහි කතුවරයා, එනම් වංසත්ථප්පකාසිනියෙහි සඳහන් කොට ඇති ආකාරයට මහානාම නම් තෙරුන් වහන්සේ, අනුරාධපුරයෙහිම වාසය කළ භික්ෂූන් වහන්සේ නමක් වන බවට නිසැකය. ඊට අමතරව මහාවංසයෙහිම තවත් තැනෙක, වට්ටගාමණී රජුගේ විශේෂ අනුග්‍රහයට පාත්‍රවී තිබෙන කුපික්කල තිස්ස තෙරුන් වහන්සේ අභයගිරි විහාරය පිළිගැනීමෙන් සිදු කරන ලද කුල සංසට්ඨ චෝදනාව හේතු කොට ගෙන මහාවිහාරයෙන් නෙරපා හරින ලද අවස්ථාව ගැන සඳහන් කොට ඇති විස්තරයෙන්ද මේ බව හොඳින් වටහා ගත හැකිය. එම විස්තරයෙහි ඇතුළත්වී තිබෙන “ඉතො” නම් පාලි වචනයෙන් “මෙතැනින්” යන සිංහලාර්ථය ලබා දෙන බව “මහාතිස්ස යයි ප්‍රසිද්ධ වූ කුලයන් හා සංසර්ග ඇති ඒ තෙරහු කුල සංසර්ග දෝෂය කරණ කොට ගෙණ සංඝ තෙමේ මේ මහ වෙහෙරින් නෙරපීය” යනුවෙන් කියා

JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

ඇති ප්‍රකාශයෙන් හොඳින් පැහැදිලි වේ (ඌනපූරණසහිතො මහාවංසො 1959: 33;96; මහාවංශය 1932: 33; 97-98). එබැවින් මහාවංසයෙහි රචකයා මහාවිහාරයෙහිම වැඩ වාසය කළ භික්ෂූන් වහන්සේ නමක් වන බවට පමණක් නොව එම ග්‍රන්ථය රචනා කරන ලද අවධියෙහිදීද උන්වහන්සේ තත් විහාරයෙහිම හෝ ඊට අනුබද්ධ වෙනත් ආයතනයක හෝ වැඩ වාසය කළ බවට නිසැකය. මහාවංස ටීකාවෙහිද මේ පිළිබඳව "ඉතො යනු මේ මහාවිහාරයෙන්" යනුවෙන් ඉතා හොඳින් පැහැදිලි කොට තිබීමෙන් මෙම නිගමනය නිවැරදි වන බව තහවුරු වේ (වංසත්ථප්පකාසිනි හෙවත් මහාවංසටීකාව 2001: 499). ඒ හැරුණු විට මහාවංසයෙහි කර්තෘත්වය සහ කාලනීර්ණය පිළිබඳව වෙනත් ශක්තිමත් සාක්ෂි කිසිවක් හෝ හමුවන බව නොපෙනේ.

මෙකී අවිනිශ්චිත භාවයම හේතු කොට ගෙන මෙහි ඉහත සඳහන් කළ පරිදි සීගිරි පර්වතයෙහි ඉදිකළ විහාරයක් පළමුවන මොග්ගල්ලාන රජු විසින් දීඝාසන විහාරයේ වාසය කළ මහානාම නම් තෙරුන් වහන්සේට පූජා කරන ලද බව මහාවංසයේ දෙවන කොටසෙහි තිස්නවවන පරිච්ඡේදයේ වාර්තා කොට තිබෙන බැවින් සද්ධම්මප්පකාසිනී නම් ප්‍රකට පාලි කෘතිය රචනා කොට ඇති තෙරුන් වහන්සේ විසින් මහාවංසයේ පළමුවන කොටස ලියා ඇති බව පරණවිතාන මහතා විශ්වාස කොට තිබේ (පරණවිතාන 1964: 375).[5] වැඩි විස්තර කිසිවක් ගෙනහැර දක්වා නැති නමුත් පහත දැක්වෙන ප්‍රකාශය ඔහු මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කොට තිබෙන බව පෙනේ. එනම් "I මොග්ගල්ලාන රජු විසින් සීගිරී පර්වතයෙහි කරවන ලද විහාරය පූජා කරන ලද්දේ (දීඝසන්ද යන්නෙහිම අපපාඨයකැයි සිතිය හැකි) දීඝාසන නම් වූ විහාරයේ වාසය කළ මහානාම නම් තෙරුන් වහන්සේටය. මේ මහානාම හිමියෝ මහාවංසයේ හා සද්ධම්මප්පකාසිනියේද කතුවරයාම මිස අන් කෙනෙකු නොවන බව සිතිය හැකිය." යනුවෙන් ඔහු මේ පිළිබඳව කරුණු ගෙනහැර දක්වා තිබේ (පරණවිතාන 1964: 375). ඒවායින් සද්ධම්මප්පකාසිනිය පිළිබඳව වැඩි දුරටත් අවධානය යොමු කොට ඇති පරණවිතාන මහතා ඒ සම්බන්ධයෙන් ගෙනහැර දක්වා ඇති අදහසක් එම කෘතියෙහි කර්තෘත්වය සහ කාලනීර්ණය වටහා ගැනීම පිණිස බෙහෙවින් ප්‍රයෝජනවත් විය හැකි බැවින් ඔහුගෙන් උපුටා ගත් එම ප්‍රකාශය මෙහි පහත ගෙනහැර දක්වනු ලැබේ.

> "පටිසම්භිදාමග්ග අටුවාව වන සද්ධම්මප්පකාසිනිය වනාහි උත්තර නමැති ඇමතියෙකු විසින් කරවන ලද පිරිවෙනක විසූ මහානාම නමැති තෙර කෙනෙකුන් විසින් ලියන ලද්දකි. එය ලියා නිමකරන ලද්දේ පළමුවන මොග්ගල්ලාන රජුගේ (508-516) ඇවෑමෙන් තුන්වැනි අවුරුද්දේය. එහිමියන් පොත් ලියූවේ කුමාරදාස රජුගේ රාජ්‍ය කාලයේදීය. එකල රජකම් කළ රජු ගැන නොතකා කලින් සිටි රජුගේ අභාවය ගැන සඳහන් කොට පොත් ලියූ කාලය ඒ අනුව දැක්වීමෙන් පෙනෙන්නේ උන්වහන්සේ කුමාරදාස රජු සමඟ අමනාපයෙන් සිටින්නට ඇති බවය." (පරණවිතාන 1964: 374).

මෙපරිද්දෙන් සද්ධම්මප්පකාසිනී නම් ග්‍රන්ථයෙහි කතුවරයා මහානාම නමැති තෙරුන් වහන්සේ නමක් වන බවට මෙන්ම උන්වහන්සේ පළමුවන මොග්ගල්ලාන රජුගේ කාලයෙහිදී වාසය කළ කෙනෙකු වන බවට පරණවිතානයන් විශ්වාස කොට තිබෙන බව පෙනේ. එහෙත් පරණවිතානයන්ම මෙහි ඉතා නිවැරදිව සඳහන් කොට ඇති පරිදි එම තෙරුන් වහන්සේ උත්තර නමැති ඇමතියෙකු විසින් කරවන ලද පිරිවෙනක වාසය කළ බවට තහවුරු වන බැවින් මේ විස්තරය දීඝසන්ද පිරිවෙනෙහි වාසය කළ මහානාම හිමියන් ගැන වංසත්ථප්පකාසිනියෙහි කියා ඇති තොරතුරු සමඟ කිසිසේත්ම නොගැළපෙන බව ඉතා පහසුවෙන්ම වටහා ගත හැකිය. එමෙන්ම උන්වහන්සේ විසින් මහාවංසය ලියන ලද බවට මෙම ග්‍රන්ථයෙහි කවර හෝ ඉඟියක් ඇතුළත්ව තිබෙන බවද නොපෙනේ. එබැවින් සද්ධම්මප්පකාසිනිය රචනා කොට ඇති ලේඛකයාගේ පෞද්ගලික සංඥානාමය වන මහානාම නමැති නාමය අතාර්කික අන්දමින් මහාවංස කතුවරයාට ආරෝපණය කිරීමට හෝ ඉහත සඳහන් කරන ලද වංසත්ථප්පකාසිනි පාඨය සමඟ එම තෙරුන් වහන්සේගේ නාමය නොගැළපෙන අන්දමින් සම්බන්ධ

[5] මහාවංසයෙහි මේ පිළිබඳව "හේ මේ එම සීගිරි ගල විහාරයක් ඉදිකොට දීඝාසන විහාරයෙහි මහානාම තෙරුන් දෙවී" යනුවෙන් සඳහන් කොට තිබේ. 39වැනි පරිච්ඡේදයේ 42වැනි ගාථාව බලන්න.

JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

කිරීමට හෝ පරණවිතාන උත්සාහ දරා ඇති බව මෙයින් ඉතා හොඳින් පැහැදිලි වේ. එහෙත් ඔහු මෙම විස්තරයෙහිදීත් මෙහි පහත සඳහන් කොට ඇති තවත් අවස්ථාවකදීත් ඉතා හොඳින් පෙන්වා දී ඇති පරිදි පළමුවන මොග්ගල්ලාන රජුගේ පාලන කාලයට ආසන්න අවධියකදී පොත්පත් ලියූ, මහානාම නමින් සිටි භික්ෂූන් වහන්සේලා කිහිප නමක්ම වාසය කොට තිබෙන හෙයින් මහාවංසයෙහි කතුවරයා වූ මහානාම හිමියනට අමතරව එනමින් සිටි තවත් භික්ෂූන් වහන්සේලා කිහිප දෙනෙකු ගැනම එකල තොරතුරු වාර්තාවී තිබෙන බව දක්නට ලැබේ.

එපමණක් නොව ඉන්දියානු අභිලේඛනයක සඳහන්වී තිබෙන විස්තරයක් ඇසුරින් මහාවංසයෙහි කර්තෘත්වය පිළිබඳව අවධානය යොමු කොට තිබෙන පරණවිතාන මෙම ප්‍රවේශයෙන්ම තවත් තැනෙක මේ සම්බන්ධයෙන් කරුණු ගෙනහැර දක්වා ඇති බැවින් ඔහුගෙන් උපුටා ගත් එම කෙටි ජේදය පාඨක සුබාවබෝධය පිණිස මෙහි පහත ගෙනහැර දක්වනු ලැබේ. ඔහු සඳහන් කොට ඇති ආකාරයට:

> "මහානාමන් නමැති ලාංකික ස්ථවිර කෙනෙකු බුද්ධගයාවේ ප්‍රතිමාලයක් කරවූ බව දක්වන බුද්ධගයා සංස්කෘත ශිලා ලිපිය ගැනද මෙහිදී සලකා බැලිය යුතුය. මහානාමන් නමැති මේ තෙරණුවෝ උපසේන නමැති තෙරණු කෙනෙකුන්ගේ ශිෂ්‍යයෙක් වූහ. උපසේන තෙරුණුවෝද මහානාම යන නමම ඇතිව සිටි වෙනත් තෙරණු කෙනෙකුන්ගේ ශිෂ්‍යයෙක් වූහ. සද්ධම්මප්පකාසිනිය ලියූ මහානාම හිමියන් සද්ධම්මපජ්ජෝතිකාව ලියූ උපසේන හිමියන්ගේ ශිෂ්‍යයෙකු වෙන්නට ඇතැයි කලින්ම සඳහන් කරන ලදී. බුද්ධගයාවේ සංඝාරාමයක් කරවූ මහානාම හිමියන් නම් මහාවංසය සහ සද්ධම්මප්පකාසිනියද ලියූ මේ මහානාම තෙරුණුවන්ම බවත් ඒ හිමියන්ගේ ආචාර්යවරයා වූ උපසේන හිමියන් සද්ධම්මපජ්ජෝතිකාව ලියූ බවත් මේ අනුව සිතීමට ඉඩ තිබේ. මේ සෙල්ලිපිය ලියා තිබෙන්නේ නම නොකී වර්ෂ ක්‍රමයක 269 වැන්නේදීය. ගුප්ත වර්ෂ ක්‍රමය අනුව මෙය ගැළපෙන්නේ ක්‍රිව 588-89 වැන්ටය. එය මේ ඒකීකරණයට පටහැනි වෙයි. එහෙත් පසුව ප්ලීට් මහතා දැක්වූ පරිද්දෙන් මෙය කලචුරි හෙවත් චේදි වර්ෂ ක්‍රමය යයි සැලකුව හොත් මෙය ක්‍රිව 518 වැන්නට ගැලපෙයි. එය ඉහත සඳහන් කළ ඒකීකරණයට අනුකූල වෙයි." (පරණවිතාන 1964: 375).

මෙපරිද්දෙන් (ජ්‍යෙෂ්ඨ) මහානාම තෙරුන් වහන්සේගේ ශිෂ්‍යයෙකු වූ සද්ධම්මපජ්ජෝතිකාව නමැති ග්‍රන්ථය රචනා කරන ලද උපසේන නම් තෙරුන් වහන්සේද, එම තෙරුන් වහන්සේගේ ශිෂ්‍යයෙක් වූ (කනිෂ්ඨ) මහානාම නම් තවත් හිමිනමක්ද යනුවෙන් භික්ෂූන් වහන්සේලා තිදෙනෙකු ගැන පරණවිතානයන් මෙහි කරුණු සඳහන් කොට ඇති බව දක්නට ලැබේ. ඔවුනතුරින් මහාවංසය සහ සද්ධම්මප්පකාසිනිය යන ග්‍රන්ථ දෙක රචනා කොට ඇති (කනිෂ්ඨ) මහානාම නම් හිමි ලංකාවෙන් ඉන්දියාවට ගොස්, බුද්ධගයාවෙහි සංඝාරාමයක් පිහිටුවා ඒ බව සංස්කෘත සෙල්ලිපියක වාර්තා කොට ඇති මහානාමන් නමැති භික්ෂූන් වහන්සේම වන බවට පරණවිතාන විශ්වාස කොට තිබෙන බව පෙනේ (Levi 1929). එපමණක් නොව එම සෙල්ලිපියෙහි සඳහන් කොට ඇති "ආමුද්වීපාධිවාසී පෘථුකුලජලධිස් තශ්‍ය ශිෂ්‍යයො මහීයාන් ලංකාද්වීපප්‍රසූතහ් පරහිතනිරතහ් සන්මහානාමනාමා" නම් සංස්කෘත පාඨයට අනුව උන්වහන්සේ මහාවංසය රචනා කළ තෙරුන් වහන්සේ ලෙසට පහසුවෙන් හඳුනා ගත හැකියැයිද පරණවිතාන මහතා විශ්වාස කොට තිබෙන බව දක්නට ලැබේ. ඔහුගේ මතයට අනුව මෙම ප්‍රකාශය තුළ මහානාම නමැති පාණ්ඩිත්‍ය සපිරි සාගරයෙන් මතු වූ මහාවංසය යන කාව්‍යමය අදහස හෙවත් මහාවංසය නමැති ග්‍රන්ථයෙහි කතුවරයා මහානාම නම් විය යනුවෙන් වන සරල සිංහල අදහස ඇතුළත්ව තිබේ. ඒ අනුව මහානාම නම් තෙරුන් වහන්සේ විසින් රචනා කොට ඇති බුද්ධගයා සෙල්ලිපියේ සඳහන්වී තිබෙන විස්තරය මහාවංසය හැඟවීම පිණිස යොදා ඇති බවටත් එබැවින් එම තෙරුන් වහන්සේ විසින් මහාවංසය පමණක් නොව පළමුවන අග්ගබෝධි රජුගේ (571-604) කාලයෙහිදී සද්ධම්මප්පකාසිනිය නම් කෘතිය සංග්‍රහ කොට තිබෙන බවත් පෙන්වා දීමට පරණවිතාන මහතා බලවත්

JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

උත්සාහයක් දරා ඇති බව පෙනේ (Paranavitana 1962: 269-286; පරණවිතාන 1967: 197).

එහෙත් ඔහු එක් අවස්ථාවකදී සද්ධම්මප්පකාසිනි නමැති ග්‍රන්ථය මහානාම හිමියන් විසින් හයවන සියවස මුල් භාගයෙහිදී සිටි කුමාරදාස (508-516) රජුගේ කාලයෙහිදීත් තවත් තැනෙකදී එය හයවන සියවස අග භාගයෙහි සහ හත්වන සියවස මුල් භාගයෙහිදී සිටි පළමුවන අග්ගබෝධි (571-604) රජුගේ කාලයෙහිදීත් යනුවෙන් රචනා කොට තිබෙන ග්‍රන්ථයක් වන බවට අවස්ථානුකූල අන්දමින් දෙවිධියකට විස්තර කොට ඇති හෙයින් ඒවා වගකීම් විරහිත හුදු හිතලු පමණක්ම වන බවට විශ්වාස කළ හැකිය. එමෙන්ම බුද්ධගයා සෙල්ලිපිය රචනා කොට ඇති වර්ෂ ක්‍රමය ඉතා ප්‍රවේශමෙන් තම අවශ්‍යතාවයට අනුව පරණවිතානයන් මෙහිදී තෝරා ගැනීමට උත්සාහ ගෙන තිබෙන බවද වටහා ගත හැකිය. එසේ වුවත් බුද්ධගයා අභිලේඛනය සම්බන්ධයෙන් පරණවිතානයන් විසින් ඉදිරිපත් කොට ඇති අදහස් සාධාරණ හේතු මත ඔස්කාර් වොන් හිනුබර් විසින් මෑතදී මුළුමනින්ම පාහේ ප්‍රතික්ෂේප කොට තිබෙන බව දක්නට ලැබේ (Hinuber 1996). එබැවින් සත්‍ය වශයෙන්ම පරණවිතාන විසින් බුද්ධගයා සෙල්ලිපිය පිළිබඳව පමණක් නොව මහාවංසයේ කර්තෘත්වය සහ කාලනීර්ණය ගැන ගෙනහැර දක්වා ඇති අදහස් සමූහයම සැකයකින් තොරව තහවුරු වන නිගමන නොව, සාධාරණ පදනමකින් තොර හුදු කාල්පනික විශ්වාස පමණක්ම වන බව ඉතා පහසුවෙන් වටහා ගත හැකිය.

4. **නිගමනයඃ**

මහානාම නමින් හඳුන්වන ලද භික්ෂූන් වහන්සේලා ගණනාවක්ම මේ කාලයෙහි වාසය කොට තිබෙන බව පරණවිතානයන්ගේ විස්තරවලින්ම ඉතා පහසුවෙන් වටහා ගත හැකි බැවින් මහාවංසය රචනා කළ මහානාම තෙරුන් වහන්සේ මේ අතුරින් කවරෙකුදැයි යන්න නිවැරදිව හඳුනා ගැනීම කිසිසේත් පහසු කාර්යයක් නොවන බව පෙනේ. සත්‍ය වශයෙන්ම උන්වහන්සේ වාසය කළ කාලය පිළිබඳව නිශ්චිත තොරතුරු කිසිවක් හෝ ශේෂව පවත්නා බවද නොපෙනේ. එමෙන්ම මහාවංසයෙහි කතුවරයා මෙහි ඉහත සඳහන් කරන ලද මහානාම නමැති තෙරුන් වහන්සේලා අතුරින් කිසිවෙකු හෝ නොව එකල විසූ වෙනත් මහානාම තෙර කෙනෙකු වීමට පවා ඉඩකඩ තිබේ. එපමණක් නොව ඉහත සඳහන් කළ පරිදි මෙන්ඩිස් විසින් පෙන්වාදී ඇති ආකාරයට මහාවංස ටීකාවෙහි මේ පිළිබඳව එන සඳහන පවා බෙහෙවින් සැක සහිත එකක් වන බව පෙනේ (Mendis 1930: 19). එබැවින් මේ පිළිබඳව කරුණු පැහැදිලි කොට නැති නමුත් කිරිබමුණේද ඉතා නිවැරදිව සඳහන් කොට ඇති පරිදි මහාවංසයේ කාලනීර්ණය සහ කර්තෘත්වය යනු තවමත් නොවිසඳුණු ප්‍රශ්න අතරට ඇතුළත් කළ හැකි එකකි (Kiribamune 1977: 55).[6]

එසේ වුවත් **මහාවංසයේ** ප්‍රථම භාගයෙහි ආවරණය කොට තිබෙන කාලපරිච්ඡේදයේ අවසානතම අවධියට අයත් වන මහසෙන් (274-301) රජුගේ පාලන සමය සැලකිල්ලට ගත් විට ඉන් පසු කිසියම් අවස්ථාවකදී, එනම් හතරවන සියවසේ මුල් භාගයෙන් පසු අවස්ථාවකදී, මෙම කෘතිය ලියා ඇති බවට පමණක් නිසැකවම තීරණය කළ හැකිය. එමෙන්ම මෙහි ඉහත පැහැදිලි කළ ආකාරයට මහාවංස ටීකාව දඹදෙණි සමයෙහිදී රචනා කොට ඇති කෘතියක් නම් මහාවංසය ඊට පෙර අවධියකදී සංග්‍රහ කොට තිබෙන ග්‍රන්ථයක් විය යුතුය. මෙම කෘතියෙහි කාලනීර්ණය සම්බන්ධයෙන් ඊට වඩා නිශ්චිත ප්‍රකාශයක් සිදු කිරීමට තරම් කිසිදු සාක්ෂියක් හමුවන බව නොපෙනේ. එසේ වුවත් එහි කතුවරයා වූ මහානාම තෙරුන් වහන්සේ ක්‍රිව පස්වන සියවසේ අග භාගයෙහිදී හා හයවන සියවසේ මුල් භාගයෙහිදී සිටි පළමුවන මොග්ගල්ලාන (491-508) රජුගේ කාලයෙහිදී වාසය කළ භික්ෂූන් වහන්සේ නමක් විය හැකියැයි බෙහෙවින් සැක සහිතව හෝ විශ්වාස කළහොත් මහසෙන් රජුගේ කාලයෙන් සියවස් දෙකකට පමණ පසු අවස්ථාවක මෙම කෘතිය රචනා කොට ඇති බවට අනුමාන කළ හැකිය. එහෙත් සවිස්තරව පැහැදිලි කොට නැති නමුත් ප්‍රකට ඉතිහාසඥයෙකු වූ මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධනයන්ද පෙන්වාදී ඇති පරිදි **මහාවංසය** යනු ක්‍රිව හයවන සියවසෙහිදී රචිත කෘතියක් ලෙසට මෙපරිද්දෙන් පොදුවේ සලකන නමුත් එය ඊට වඩා පසු කාලීන අවධියකට අයත් ග්‍රන්ථයක් වශයෙන් වුවද කෙනෙකුට තර්ක කළ හැකි බව පෙනේ (Gunawardana 1979: 4;

[6] "The date and authorship of the Mahavamsa also falls into this category of unsolved problems."

Somathilake 2017: 48). එබැවින් එහි විස්තෘත කරුණු අතුරින් අවසාන අවධියට අයත් වන විස්තර, එනම් වඩා මෑත කාලීන සමයට අයත් වන තොරතුරු, පවා අදාළ කතුවරයා ජීවත් වූ කාලපරිච්ඡේදයට ආසන්න සමයකදී සිදු වූ සිද්ධීන් නොව ඉන් සියවස් තුන හතරකට පෙර අවස්ථාවකට සම්බන්ධ ඒවා වන බවට ඉතා පහසුවෙන්ම විශ්වාස කළ හැකිය.

ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි නාමාවලිය

– අංක 277190, 277191 සහ 277587 දරන පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙහි ප්‍රධාන පුස්තකාලයේ ඇති පුස්කොළ පොත්.

– ඉලංගසිංහ, මංගල (2003), මහාවංසය හා ශ්‍රී ලංකාවේ ඉතිහාස සම්ප්‍රදාය, මහරගම: තරංජි ප්‍රින්ටර්ස්.

– ඌනපූරණසහිතො මහාවංසො (1959), සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම් ඩී ගුණසේන සහ සමාගම.

– කා, ඊ එච් (1973), ඉතිහාසය යනු කුමක්ද, පරි. චරිතා විජේරත්න, මහරගම: රාවය ප්‍රකාශයෝ.

– කිරිබමුණේ, සිරිමා (2005), "මහාවංසය හා ලක්දිව පැරණි ඓතිහාසික සම්ප්‍රදාය," ඉතිහාසයේ අතීතය: ශික්ෂණයක වර්ධනය පිළිබඳ විමර්ශනයක්, සංස්. රණවීර ලෙස්ලි ගුණවර්ධන, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

– දීපවංසය (1980), සංස්. කිරිඇල්ලේ ඤාණවිමල, කොළඹ: ගුණසේන සමාගම.

– පරණවිතාන, එස් (1964), "මෑත යුගයේ සභ්‍යත්වය: ආගම සාහිත්‍ය හා කලාව," ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, සංස්. හේමචන්ද්‍ර රායි, පළමු කාණ්ඩය, පළමු භාගය.

– පරණවිතාන, එස් (1967), "මහාවංසය ලියූ මහානාම හිමිපාණෝ," යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම උපහාර අංකය, සංස්. සිරි ගුණසිංහ සහ තවත් අය.

– පෙරේරා, ලක්ෂ්මන් සු (1964), "ලංකා ඉතිහාසයේ මූලාශ්‍රයයෝ," ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, සංස්. හේමචන්ද්‍ර රායි, පළමු කාණ්ඩය, පළමු භාගය.

– මහාවංශය (1932), පරි. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි හා ශ්‍රී දේවරක්ෂිත දොන් අන්ද්‍රිස් ද සිල්වා බටුවන්තුඩාවේ, කොළඹ: රාජකීය මුද්‍රණාලය, ප්‍රථම භාගය.

– මහාවංසය (2004), දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

– මහාවංසය (2007), සංස්. ආනන්ද ඩබ් පී ගුරුගේ, පරි. තිස්ස කාරියවසම්, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝරයෝ.

– මහාවංසෙ (1877), සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි හා ශ්‍රී දේවරක්ෂිත දොන් අන්ද්‍රිස් ද සිල්වා බටුවන්තුඩාවේ, කොළඹ: විලියම් හෙන්රි හර්බර්ට් රජයේ මුද්‍රණකරු, දුතියො කණ්ඩො.

– මහාවංසෙ (1908), සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි හා ශ්‍රී දේවරක්ෂිත දොන් අන්ද්‍රිස් ද සිල්වා බටුවන්තුඩාවේ, කොළඹ: එච් සී කොට්ල් රජයේ මුද්‍රණකරු.

– ලියනගමගේ, අමරදාස (1989), මධ්‍යකාලීන ලංකා ඉතිහාසය, කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

– වංසත්ථප්පකාසිනී මහාවංසටීකා නම් වූ සිංහල අනුවාදය (1994), සංස්. අකුරටියේ අමරවංස හිමි හා හේමචන්ද්‍ර දිසානායක, කැලණිය.

– වික්‍රමසිංහ, සිරිමා (1965), "ඓතිහාසික මූලාශ්‍ර: ස්වදේශීය සාහිත්‍ය කෘති," අනුරාධපුර යුගය, සංස්. අමරදාස ලියනගමගේ සහ රණවීර ගුණවර්ධන, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය, දෙවැනි සංශෝධිත සංස්කරණය.

– විජේතුංග, ඩබ් එම් කේ (2012), "ඓතිහාසික සම්ප්‍රදායේ විකාශය," ශ්‍රී ලාංකේය ඉතිහාසය, සංස්. ඩබ් එම් කේ විජේතුංග, කොළඹ: ගුණසේන සමාගම, දෙවැනි වෙළුම.

– සිරිවීර, ඩබ් අයි (2001), රජරට ශිෂ්ටාචාරය සහ නිරිතදිග රාජධානි, කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම, පළමුවැනි වෙළුම.

– සිරිවීර ඩබ් අයි (2005), ශ්‍රී ලංකාවේ කෘෂි ඉතිහාසය, කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ 2005.

– සිරිවීර, ඩබ් අයි (2012), "දේශීය ඉතිහාස රචන සම්ප්‍රදාය," ශ්‍රී ලාංකේය ඉතිහාසය, සංස්. ඩබ් එම් කේ විජේතුංග, කොළඹ: ගුණසේන සමාගම, පළමුවැනි වෙළුම.

– සුමනජෝති හිමි, දෙගම්මැද (2017), දඹදෙණි යුගය, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

– සෝමතිලක, මහින්ද (2014), ශ්‍රී ලාංකේය බෞද්ධ ශාසනයෙහි සමාරම්භය, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

– සෝමතිලක, මහින්ද (2021), ශ්‍රී ලංකාවේ ඉතිහාසය රචනා කිරීම: මූලාශ්‍ර භාවිතය සහ අර්ථකථන සැපයීම, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

– සෝමතිලක, මහින්ද (2022), මහාවංසය: කර්තෘත්වය සහ කාලනිර්ණය, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

– Adikaram, E W (1953), Early history of Buddhism in Ceylon, Colombo: Gunasena and co.

– Culavamsa (1925), ed. W Geiger, London: Pali Text Society, Vol.I.

– Culavamsa (1953), tr. W Geiger, Colombo: Ceylon Government Information Department.

– Davids, T W Rhys (1905), "Dipavamsa und Mahavamsa und die geschichtliche ueberlieferung in Ceylon von Wilhelm Geiger, (Bohme, Leipzg)," The Journal of the Royal Asiatic Society of Great Britain and Ireland.

– Fleet, J F (1909), "The day on which Buddha died," The Journal of the Royal Asiatic Society of Great Britain and Ireland.

– Geiger, W (1908), Dipavamsa and Mahavamsa, Colombo.

– Gunawardana, R A L H (1979), "The people of the lion: The Sinhala identity and ideology in history and historiography," The Sri Lanka Journal of the Humanities, Vol.V, No.1 & 2.

– Hinuber, Oskar von (1996), Handbook of Pali Literature, Berlin.

– Kiribamune, Sirima (1977), "Geiger and the history of Sri Lanka," The Ceylon Journal of Historical and Social Studies, Vol. VII, No.1.

– Law, B C (1929), On the chronicles of Ceylon, Royal Asiatic Society of Bengal, 1947.

– Levi, Sylvain "L'Inscription de Mahanama a Bodh-Gaya: Essai d' Exegese, Appliquee a l' Epigraphie Bouddhique," Indian studies in honour of Charles Rockwell Lanman, Cambridge Mass, Harvard University Press.

– Mahawanso (2016), tr. George Turnour, Cotta Church Mission Press (Colombo, 1837) Colombo: Central Cultural Fund Press.

–

– Malalasekara, G P (1928), The Pali literature of Ceylon, London: Royal Asiatic Society of Great Britain and Ireland.

– Mendis, G C (1930), A historical criticism of the Mahavamsa Chapters I – XX, Unpublished Ph.D Thesis, University of London.

– Mendis, G C (1950), "Addendum," The Mahavamsa or the great chronicle of Ceylon, ed. Wilhelm Geiger, tr. Mabel Haynes Bode, Colombo: Ceylon Government information Department.

– Paranavitana, S (1962), "Mahanaman, the author of the Mahavamsa," University of Ceylon Review, Vol.XX.

– Snyder, Edmund Nathaniel (1891), Der Commentar und die textuberliferung des Mahavamsa, Berlin.

– Somathilake, Mahinda (2017), Indo Sri Lanka relations: From prehistoric to pre-colonial times, Colombo: S Godage and Brothers.

– The Mahavansa (1909), tr. L C Wijesinha, H M Richards, Colombo: Acting Government Printer.

– The Mahavamsa (1950), tr. W Geiger, Colombo: Government Information Department.

– Vamsatthappakasini Commentary on the Mahavamsa (1935), ed. G P Malalasekara, Pali Text Society, London: Oxford University Press, Vol.II.

JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk